රාජ්‍ය නිලධාරීන් විසින් අත් කරගත යුතු
රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳව කරුණු අධ්‍යයනය කොට
නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද
නිලධාරී කමිටුවේ වාර්තාව

අමාත්‍ය මණ්ඩල කාර්යාලය

2013-05-29

අන්තර්ගතය

1. හැඳින්වීම 01

2. නිලධාරි කමිටුවේ රැස්වීම් 05

3. දැනට බලපැවැත්වෙන විධිවිධාන අනුව අපේක්ෂිත ප්‍රවීණතා මට්ටම් ... 07

4. අපේක්ෂිත ප්‍රවීණතාව අත්කර ගැනීමට අපහසුවීම සම්බන්ධයෙන් නිලධාරි කමිටුවේ නිරීක්ෂණ 09

5. විද්වත් කමිටුව විසින් යෝජිත විෂය නිර්දේශ හා ඇගයීම් ක්‍රමවේදය ... 17

6. විද්වත් කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන නිලධාරි කමිටුව විසින් යෝජිත ප්‍රවීණතා මට්ටම් 29

7. නිලධාරි කමිටුව විසින් යෝජිත ප්‍රවීණතා මට්ටම් දැක්වෙන සටහන 31

8. නිලධාරි කමිටුවේ නිර්දේශ 37

ඇමුණුම් ලැයිස්තුව

I වන ඇමුණුම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007, 07/2007(I), 07/2007(II), 07/2007(III)	**51**
II වන ඇමුණුම	2012-04-19 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන	**59**
III වන ඇමුණුම	ඉහත සටහන සම්බන්ධයෙන් වූ, 2012-05-23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	**65**
IV වන ඇමුණුම	නිලධාරි කමිටුවේ කටයුතු සඳහා සහාය ලබා දුන් අනු කමිටු	**69**
V වන ඇමුණුම	නිලධාරි කමිටු රැස්වීම් සඳහා විවිධ අවස්ථාවලදී සහභාගී වූ/වාචිකව කරුණු ඉදිරිපත් කළ නිලධාරින් හා වෘත්තීය සමිති	**71**
VI වන ඇමුණුම	නිලධාරි කමිටුව වෙත ලැබුණු ලිඛිත නියෝජනයන්..	**75**
VII වන ඇමුණුම	රාජ්‍ය සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේදී භාවිතයට ගැනීම සඳහා යෝජිත ග්‍රන්ථ	**77**
VIII වන ඇමුණුම	"සිංහල අකුරු පොත" සහ "දෙමළ අකුරු පොත" රචනා කළ විද්වත් කමිටුව	**79**
IX වන ඇමුණුම	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන ආයතන හා නිලධාරින්	**81**
X වන ඇමුණුම	ස්තුතිය	**91**

1. හැඳින්වීම:

1.1 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරින් විසින් තමන් රාජ්‍ය සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අත් කරගත යුතු භාෂා ප්‍රවීණතාව පිළිබඳව අදාළ විධිවිධාන 2007-05-28 දිනැති අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වේ. [I වන ඇමුණුම] එකී චක්‍රලේඛ විධිවිධාන අනුව, 2007-07-01 දිනෙන් පසුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන හා තනතුරුවලට පත් කරනු ලබන නිලධාරින් සිය පත්වීමේ දින සිට වසර පහක් (05) ඇතුළත නියමිත මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වන අතර, නියමිත කාලය තුළ භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක විලම්බනය කළ යුතුවේ. මේ තත්ත්වය නිසා උද්ගත වී ඇති ඇතැම් ගැටලු නිරාකරණය කරගැනීම පිණිස, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ගරු අමාත්‍යතුමා විසින් “රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණීන්ට ද්විභාෂා හැකියාව ලබාදීම” යන මැයෙන් වූ 2012-04-19 දිනැති ඒකාබද්ධ සටහනක් (අමප12/0555/520/002) අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. [II වන ඇමුණුම]

1.2 එම සටහනෙහි යෝජනා පහක් (05) අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කර තිබූ අතර, එම යෝජනා අතුරින් I හා V යෝජනා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් 2012-05-23 දින පහත සඳහන් පරිදි අනුමැතිය දෙන ලදී: [III වන ඇමුණුම]

(අ) 2007-07-01 දින සිට 2010-06-30 දින දක්වා රාජ්‍ය සේවයට බඳවාගනු ලැබූ නිලධාරින්ට නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත් කරගැනීම සඳහා අවසාන අවස්ථාව ලෙස වසර දෙකක (02) සහන කාලපරිච්ඡේදයක් පමණක් ලබාදීම; සහ

(ආ) අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 2 වන ඡේදයේ සඳහන් "වැටුප් වර්ධකය විලම්බනය කිරීම" වෙනුවට "වැටුප් වර්ධකය නතර කිරීම" යනුවෙන් යෝග්‍ය පරිදි සංශෝධනය කිරීම.

1.3 එම සටහනේ වූ II, III, හා IV වන යෝජනාවන් සම්බන්ධයෙන් අධ්‍යයනය කළ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින්, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ නියමිත ප්‍රවීණතාව අත් කරගැනීම පිණිස රජය විසින් මෙතෙක් ලබාදී තිබූ අනුග්‍රහයන්ගෙන් නියම ප්‍රයෝජනය ලබාගැනීමට රාජ්‍ය නිලධාරින් විශාල සංඛ්‍යාවක් අපොහොසත් වීම කෙරෙහි, ගරු අමාත්‍යතුමන් දෙපළ විසින් ඉදිරිපත් කරන ලද ඉහත සටහනේ I වන ඇමුණුමෙහි දැක්වුණු නිලධාරි කමිටුවේ වාර්තාවේ දක්වා ඇති කරුණු බලපා ඇති බව නිරීක්ෂණය කරන ලදී. එම හේතුවලට අතිරේකව, අංක: 07/2007 චක්‍රලේඛයේ විධිවිධාන අනුව අදාළ නිලධාරින්ගෙන් අතිශයින් ඉහළ මට්ටමේ ප්‍රවීණතාවක් අපේක්ෂා කිරීම ද මේ තත්ත්වය කෙරෙහි දැඩි ලෙස බලපා ඇති බව ද තවදුරටත් නිරීක්ෂණය කරන ලදී.

1.4 ඒ අනුව, රාජ්‍ය සේවයේ විවිධ ශ්‍රේණිවලට අයත් නිලධාරින්ට, ඔවුන්ට අදාළ වන පරිදි තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවෙන් සිය රාජකාරී හා වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් දැනුමක් අත් කරගැනීම හා එම දැනුම මැන බැලීම සඳහා, එක් එක් සේවක වර්ගවලට යෝග්‍යවන පරිදි විභාග පැවැත්වීම සම්බන්ධයෙන් සවිස්තරව පරීක්ෂා කර බලා, ඒ වෙනුවෙන් ක්‍රමවේදයක් සකස් කොට, අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා, ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට පහත සඳහන් අයගෙන් සමන්විත නිලධාරි කමිටුවක් පත් කරන ලදී:

- අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - (සභාපති);
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්;
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් - (කැඳවුම්කරු)*;
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයකු;

---

* ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, කමිටු රැස්වීම් කැඳවීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සිදු කරන ලදී.

- ආයතන අධ්‍යක්ෂ ජනරාල්;
- විභාග කොමසාරිස් ජනරාල්;
- රාජ්‍ය භාෂා කොමසාරිස්; සහ
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන, ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිතයකු**.

**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පෞද්ගලිකවම රැස්වීම්වලට සහභාගි විය..

2. නිලධාරි කමිටුවේ රැස්වීම්:

2.1 2012-05-31 දින සිට 2013-05-29 දින දක්වා කාලය තුළ මෙම කමිටුවේ රැස්වීම් 16ක් පවත්වන ලද අතර, කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පහසුවීම පිණිස, ආරම්භක රැස්වීම්වලදී වැඩිදුරටත් කරුණු අධ්‍යයනය කිරීම සඳහා පහත 2.2 හා 2.3 හි දැක්වෙන පරිදි අනු කමිටු දෙකකට නිශ්චිත කාර්යයන් පවරන ලදී.

2.2 රාජ්‍ය සේවයේ විවිධ සේවක වර්ගවලට අයත් නිලධාරීන් විසින් අත් කරගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම් වෙන් වශයෙන් හඳුනාගැනීම පිණිස අවශ්‍ය මූලික තොරතුරු පිළියෙල කිරීම සඳහා IV වන ඇමුණුමේ (ආ) යටතේ නම් සඳහන් නිලධාරීන්ගේ සහාය මෙම කමිටුව විසින් ලබාගන්නා ලදී.

2.3 ඵලදායී අයුරින් භාෂා ප්‍රවීණතාව අත් කරගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම, ඒ ඒ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය භාෂා ප්‍රවීණතාවට ගැළපෙන පරිදි නව විෂය නිර්දේශ සකස් කිරීම සහ යෝග්‍ය පෙළපොත් මාලාවක් සකස් කරන තෙක් අධ්‍යයන කටයුතු සඳහා සුදුසු පොත් ලැයිස්තුවක් නිර්දේශ කිරීම යන කාර්යයන් සඳහා නිලධාරි කමිටුව විසින් IV වන ඇමුණුමේ (අ) යටතේ නම් සඳහන්, ඒ වනවිට ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය විසින් සේවය ලබාගනිමින් සිටි විද්වත් කමිටුවේ අදහස් ලබාගන්නා ලදී.

2.4 V වන ඇමුණුමෙහි දැක්වෙන රාජ්‍ය නිලධාරීන් හා වෘත්තීය සමිති නියෝජිතයින් නිලධාරි කමිටුවේ රැස්වීම්වලට සහභාගී වූ අතර එම සාකච්ඡාවල විවිධ අවස්ථාවන්හිදී, ඔවුන් විසින් වැදගත් කරුණු ඉදිරිපත් කරන ලදී.

2.5 ප්‍රස්තුත කරුණු පිළිබඳ අධ්‍යයනයේදී, VI වන ඇමුණුමෙහි දැක්වෙන ලිඛිත නියෝජනයන්හි සඳහන් කරුණු ද, කමිටුව විසින් සැලකිල්ලට ගන්නා ලදී.

3. දැනට බලපැවැත්වෙන විධිවිධාන අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින්ගෙන් අපේක්ෂා කෙරෙන ප්‍රවීණතා මට්ටම්:

දැනට අදාළ වන රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම්, අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ [I වන ඇමුණුම] දක්වා ඇති ආකාරයට පහත සඳහන් කර ඇති පරිදි වර්ග 3කට අයත් වේ.

(අ) ඉහත, චක්‍රලේඛයෙහි ඇමුණුමෙහි දැක්වෙන 1 වන කාණ්ඩයට අයත් නිලධාරින් (රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් බහුතරයක්) විසින් අත් කරගත යුතු, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව වනුයේ අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ ප්‍රධාන විෂයක් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පික විෂයක් වශයෙන් නොවේ) සහ සිංහල/දෙමළ භාෂාව සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කථන පරීක්ෂණයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂිත කුසලතා විභාගයෙන් සමත්වීම වේ.

(ආ) ඉහත සඳහන් චක්‍රලේඛයෙහි ඇමුණුමෙහි දැක්වෙන 2 වන කාණ්ඩයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය සහ ඒ හා සමාන දෙපාර්තමේන්තුගත සේවාවන්, පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින්, ග්‍රාම නිලධාරින්, පවුල් සෞඛ්‍ය සේවය හා ව්‍යාප්ති සේවාවල නියුතු අනෙකුත් සියලුම ක්ෂේත්‍ර නිලධාරින් වැනි නිලධාරින් විසින් අත් කරගත යුතු, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව වනුයේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත්වීම වේ.

(ඇ) ඉහත චක්‍රලේඛයෙහි ඇමුණුමෙහි දැක්වෙන 3 වන කාණ්ඩයට අයත් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, රජයේ වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින්, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය, හෙද සේවය, පුස්තකාලයාධිපති සේවය මෙන්ම රියැදුරු හා කාර්යාල කාර්ය සහායක වැනි කනිෂ්ඨ

කාර්යමණ්ඩල විසින් ද තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අත් කරගත යුතු ප්‍රවීණතාව වනුයේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාරම්භක කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත්වීමයි.

4. රාජ්‍ය නිලධාරින් විසින් අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අපේක්ෂිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කරගැනීම අපහසු වීම සම්බන්ධයෙන් හා ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් කමිටුවේ නිරීක්ෂණ:

රාජ්‍ය නිලධාරින් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කරගැනීම සම්බන්ධයෙන් දැනට බලපැවැත්වෙන අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන, අපේක්ෂිත පරිදි ඉටු නොවීම සම්බන්ධයෙන් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින් මුහුණ පා ඇති වෙනත් ගැටලු පිළිබඳව කමිටුව විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී:

4.1 අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු:

4.1.1 අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2007-05-28 දින නිකුත් කර ඇති නමුත්, එහි සඳහන් විධිවිධාන පරිදි, භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා රාජ්‍ය නිලධාරින්ට තවමත් ප්‍රමාණවත් පහසුකම් සැලසී නොතිබීම:

(අ) අදාළ භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා ප්‍රමාණවත් පුහුණු පාඨමාලා, ස්වයංඅධ්‍යයන පාඨමාලා හෝ ඒ සඳහා විශේෂයෙන් සකස් කරන ලද පොත්පත් නොමැතිවීම;

(ආ) විශේෂයෙන් දිවයිනේ දුරබැහැර ප්‍රදේශවල සේවය කරන නිලධාරින්ට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට සුදුසු පුහුණු වැඩසටහන් නොමැතිවීම හා ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම; සහ

(ඇ) සතිඅන්තවලදී රාජකාරියේ නිරත වියයුතු නිලධාරින් ඇතුළුව රාජකාරි බහුල නිලධාරින් හට ඉහත (අ) හා (ආ)හි සඳහන් හේතු නිසා, අදාළ ප්‍රවීණතාව ලබාගැනීම අපහසු වීම.

4.1.2 ඇතැම් සේවාවල නිලධාරින්ට තම සේවා ව්‍යවස්ථාවන්හි සඳහන් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව මෙන්ම අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි දැක්වෙන ප්‍රවීණතාව ද අත් කරගැනීමට සිදුවීම; සහ

4.1.3 අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවල සඳහන් නොවන, විකල්ප සුදුසුකම් ලබාගෙන ඇති ඇතැම් රාජ්‍ය නිලධාරින් විසින් එකී චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කරගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරන ලෙස අදාළ බලධාරින් වෙතින් ඉල්ලීම් කරනු ලැබ තිබීම.

4.2 අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සඳහා නියම කර ඇති ප්‍රවීණතා මට්ටම් පිළිබඳ ගැටලු:

උක්ත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කරගැනීම සඳහා, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයෙන් සමත්විය යුතුය. එලෙස පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට විකල්පයක් වශයෙන්, අනෙක් රාජ්‍ය භාෂාව අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී මව්බස මට්ටමින්/ප්‍රධාන විෂයක් ලෙස (හර විෂයක් ලෙස) සමත්වීම පිළිගනු ලබන්නේ වුවද, එලෙස එකී විෂය හර විෂයක් ලෙස සමත්වීම පහත සඳහන් කරුණු හේතුකොට ගෙන අත් කරගැනීමට අපහසු ඉලක්කයක් වී ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.2.1 අ.පො.ස.(සා.පෙළ) සිංහල/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍රය (ප්‍රධාන විෂය) සකස් කර ඇත්තේ, ළදරු අවදියේ සිට සිංහල/දෙමළ භාෂාව භාවිත කර ඇති සහ වසර 03ක කාලයක් (09 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා) සතියකට පැය පහ (05) බැගින් සිංහල/දෙමළ භාෂාව සහ සාහිත්‍යය හැදෑරීම මගින් ප්‍රමාණවත් භාෂා දැනුමක් ලබා ඇති සිසුන් විසින් අත් කරගෙන ඇති සාධන මට්ටම මැන බැලීම පිණිසය.

4.2.2 මව්බස මට්ටමේ ප්‍රවීණතාව අත් කරගෙන ඇති අයට ඉහත අංක 3(අ)හි සඳහන් ප්‍රධාන විෂයට අදාළ ප්‍රශ්න පත්‍රයට සාර්ථක ලෙස පිළිතුරු සැපයිය හැකි වුවත්, එය දෙවන භාෂාවක් වශයෙන් ඉගෙනගත් අයට එසේ පහසුවෙන් පිළිතුරු සැපයීමට හැකියාවක් නොමැති බව මෙම වාර්තාවේ 2.3 යටතේ සඳහන් කර ඇති විද්වත් කමිටුව විසින් පෙන්වා දෙන ලදී.

4.2.3 මව්බස ලෙස භාෂාව හැදෑරූ අයගේ මට්ටමේ ප්‍රවීණතාව ලබාගැනීමට හැකිවන අයුරින් ඒ සඳහා කාලය මිඩංගු කිරීමට විශේෂයෙන්ම දුරබැහැර ප්‍රදේශවල සේවය කරන නිලධාරින්ට අවකාශ නොමැති නිසා, ඔවුන්ට සාමාන්‍ය පෙළ සිංහල/දෙමළ භාෂාව (ප්‍රධාන විෂය) ප්‍රශ්න පත්‍රයට සාර්ථක ලෙස පිළිතුරු සැපයීම ඉතා දුෂ්කර කටයුත්තක් වී ඇත.

4.3 ඇතැම් අනෙක් සේවාවන් විසින් අත් කරගත යුතු භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු:

4.3.1 පුස්තකාලයාධිපති සේවය:

සිංහල මෙන්ම දෙමළ භාෂාවෙන් ද රචිත පොත්පත් ගැන තොරතුරු විමසන අයට සහාය වීමට සිටින පුස්තකාලයාධිපති සේවය සඳහා නිර්දේශ කර ඇත්තේ කනිෂ්ඨ සේවකයන්ගෙන් අපේක්ෂිත අවම මට්ටමේ භාෂා දැනුමකි. එහෙත් මෙම කාණ්ඩය සඳහා වඩා ඉහළ භාෂා ප්‍රවීණතාවක් තිබීම ඔවුන්ගේ සේවය අපේක්ෂා කරන සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම සේවයක් ලබාදීමට පිටිවහලක් වන බැවින්, පුස්තකාලයාධිපති සේවය සඳහා දැනට නියමිත මට්ටමට වඩා ඉහළ භාෂා ප්‍රවීණතාවක් අදාළ කිරීම යෝග්‍ය බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.3.2 ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය:

අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, රජයේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා 3වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම අදාළ වන නමුත්, ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරින් සඳහා එම චක්‍රලේඛයේ කිසිදු විධිවිධානයක් සඳහන්ව නොමැත. ආයුර්වේද වෛද්‍ය නිලධාරින් ද දීපව්‍යාප්තව විවිධ ජන කොටස් සමඟ සේවය කළ යුතු බැවින්, ඔවුන් සඳහා ද දැනට රජයේ වෛද්‍ය නිලධාරින් සඳහා අදාළ වන 3 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම අදාළ කරගැනීම යෝග්‍ය බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.3.3 ගුරු සේවය:

(අ) දැනට ක්‍රියාත්මක වන අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ගුරු සේවය සම්බන්ධයෙන් අදාළ වන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳව විධිවිධාන ඇතුළත් වී නොමැත.

(ආ) ගුරු සේවය ස්ථානමාරුවලට යටත් සේවයක් වන බැවින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාවෙන් කටයුතු කරන ප්‍රදේශවල පිහිටි පාසල්වල සේවය කිරීමේදී හා අනෙක් රාජ්‍ය භාෂාවෙන් කථා කරන සිසුන් සමග කටයුතු කිරීමේදී අදාළ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබීම අවශ්‍ය වේ.

(ඇ) ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් කරා ගමන් කිරීමේදී, තම සිසු දරුවන් අනෙක් රාජ්‍ය භාෂාව ඉගෙනීම කෙරෙහි යොමු කිරීම පිණිස ගුරුවරුන් විසින් ලබා දිය හැකි මාර්ගෝපදේශකත්වය සහ ඔවුන් සතු වන සුවිශේෂ කාර්යභාරය සැලකිල්ලට ගත් විට, ගුරු සේවය සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේ විධිවිධාන අදාළ කිරීම උචිත බව පෙනේ.

(ඈ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා විදුහල්පති සේවයේ තනතුරු සඳහා ගුරු සේවයේ සුදුසුකම්ලත් අයට ඉල්ලුම් කළ හැකි බැවින්, තමන් ගුරු සේවයේ සිටින කාලය තුළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම ඔවුන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

(ඉ) එබැවින්, 2013-07-01 දින සිට ගුරු සේවයට ඇතුළත් වන ගුරුවරුන් විසින් අවුරුදු 05 ක් තුළ කමිටුව විසින් අලුතින් යෝජිත 3 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම ලබාගැනීම යෝග්‍ය වනු ඇත.

4.4 ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා සුදුසු ප්‍රවීණතා මට්ටමක් හඳුන්වාදීමේ අවශ්‍යතාව:

අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි රාජ්‍ය සේවයේ රියැදුරු හා කාර්යාල කාර්ය සහායක වැනි මට්ටම්වල සේවකයන් සඳහා ද අදාළ වන ප්‍රවීණතා මට්ටම වන්නේ වෛද්‍ය, ඉංජිනේරු, විද්‍යාත්මක වැනි ඇතැම් දීපව්‍යාප්ත සේවාවන් සඳහා නියමිත 3වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම වේ. එබැවින්, එබඳු තනතුරු සඳහා අවශ්‍ය වන භාෂා ප්‍රවීණතා මට්ටම ඉහත කී ප්‍රාථමික මට්ටමේ තනතුරු දරන නිලධාරින්ට ද අදාළ කරගැනීම යෝග්‍ය නොවන හෙයින්, එම සේවකයන්ගේ සේවා අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි, 4 වන කාණ්ඩය වශයෙන් නව ප්‍රවීණතා මට්ටමක් හඳුන්වාදීමේ අවශ්‍යතාව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.5 රාජ්‍ය අංශයේ සියලුම ආයතනවල කාර්යමණ්ඩල විසින් භාෂා ප්‍රවීණතාව අත් කරගත යුතු බව:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 වන ව්‍යවස්ථාව යටතේ දැක්වෙන විධිවිධාන අනුව මහජනතාවට සේවා සපයන සියලුම ආයතනයන් එම විධිවිධානවලට අනුගත විය යුතු වුවත්, තමන් සේවයට බඳවාගනු ලැබූ රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගැනීම අනිවාර්ය කර ඇත්තේ ආයතන සංග්‍රහයේ අර්ථකථනයට අනුව "රාජ්‍ය නිලධාරින්" ලෙස සැලකෙන රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධාරින්ට පමණි. මහජනතාව සමඟ සෘජුව සම්බන්ධ වී කටයුතු කරන අනෙකුත් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු බැංකු හා රජයට පූර්ණ වශයෙන් අයත් සමාගම් ආදියෙහි සේවකයන් විසින් ද තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව අත් කර නොගතහොත්, එම අනෙක් රාජ්‍ය භාෂාවෙන් කථා කරන හා කටයුතු කරන සේවාලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුකිරීමට එකී ආයතනවල නිලධාරින් අපොහොසත් වනු ඇත. එබැවින්, රාජ්‍ය සේවයට අදාළ කරනු ලබන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවන් එකී ආයතන සඳහා ද අදාළ කරගැනීම යෝග්‍ය බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.6 මව්බස නොවන අනෙක් රාජ්‍ය භාෂාව අ.පො.ස. (සා.පෙළ) මට්ටමේදී හැදෑරීමට ඇති බාධා:

4.6.1 දැනට පවතින විභාග ක්‍රමවේදය අනුව ආගම, මව්බස, ඉතිහාසය, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය යන අනිවාර්යයෙන් හැදෑරිය යුතු හර විෂයන් හය (06) ද ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා උපරිම වශයෙන් විෂයන් නවයක් (09) තෝරා ගැනීමට විභාගය සඳහා පෙනී සිටින සිසුන්ට අවස්ථාව තිබේ. විකල්ප විෂයන් තුන (03) තෝරා ගැනීම සඳහා වන විවිධ විෂයන් අඩංගු කාණ්ඩ තුනෙන් (03) එක් කාණ්ඩයකින් එක් විෂයක් බැගින් තෝරාගත යුතු වේ. දෙවන භාෂාව (සිංහල) හා දෙවන භාෂාව (දෙමළ) විෂයන් අන්තර්ගත වන විෂය කාණ්ඩය තුළම, බොහොමයක් සිසුන් උසස් පෙළට හැදෑරීමට අපේක්ෂා කරන විෂය ධාරාවන්ට අදාළ විෂයන් ද ඇතුළත් වන බැවින් ඔවුන් දෙවන භාෂාව (සිංහල) හෝ දෙවන භාෂාව (දෙමළ) හෝ විෂය තෝරා ගැනීමට යොමු නොවන බව පෙනේ. තව ද, මව්බස මට්ටමින් පෙනී සිටිය හැක්කේ සිංහල හෝ දෙමළ හෝ භාෂා දෙකෙන් එක් විෂයකට පමණි. ඒ අනුව, මව්බස නොවන අනෙක් රාජ්‍ය භාෂාව අ.පො.ස. (සා.පෙළ) මට්ටමේදී හැදෑරීමට සිසුන්ට ඇති අවස්ථාව ඉතාමත් සීමිත බව නිරීක්ෂණය වේ.

4.6.2 රාජ්‍ය සේවයේ තනතුරු සඳහා අයදුම් කිරීමේදී නියම කර ඇති සුදුසුකම්වලට අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ඇතුළත් නොවීම හේතුවෙන්, තමන්ගේ මව්බස නොවන අනෙක් රාජ්‍ය භාෂාව සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී [දෙවන බස (Second Language) මට්ටමින් හෝ] පෙනී සිටීම සඳහා පෙලඹවීමක් නොමැතිවීම ද නිරීක්ෂණය වේ.

4.7 අදාළ අනෙක් රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීමට පහසු වන ලෙස එම භාෂාව සක්‍රියව භාවිත වන ප්‍රදේශයන්හි සැලකිය යුතු කාලයක් සේවය කිරීම පිණිස අවස්ථාව ලැබෙන පරිදි රාජ්‍ය නිලධාරීන් සඳහා සුදුසු ස්ථානමාරු ක්‍රමවේද හඳුන්වා දීමේ අවශ්‍යතාව:

අදාළ අනෙක් රාජ්‍ය භාෂාව ඇතුළුව යම් භාෂාවක් සක්‍රියව භාවිත වන ප්‍රදේශයක නිශ්චිත කාලයක් සේවය කිරීම, එකී භාෂාව ඉගෙන ගැනීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමය බව ප්‍රායෝගිකව තහවුරු වී ඇති කරුණකි.

එබැවින්, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව, සිය පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයක පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක [මෙම වාර්තාවේ 8.1.1 (උ) පරිදි ප්‍රකාශයට පත් කරනු ලබන] තිබෙන රාජ්‍ය ආයතනයක නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් සක්‍රීයව සේවය කිරීම සඳහා අවස්ථාව ලබාදීම තුළින් ඔහු/ඇය සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් දැනුමක් ලබාගැනීමට අවස්ථාව ලබාදිය හැකි බව නිරීක්ෂණය කරන ලදී.

4.8 අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණතාවක් ලබාගැනීම සඳහා රාජ්‍ය නිලධාරින් දිරිගැන්වීමේ අවශ්‍යතාව:

තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන්, (චක්‍රලේඛ මගින් අපේක්ෂිත ප්‍රවීණතාව ඉක්මවා) සිය කැමැත්තෙන්ම අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී මව්බස මට්ටමේ (හර විෂයක් වශයෙන්) ප්‍රවීණතාව ලබාගැනීම සඳහා රජයේ නිලධාරින් උනන්දු කරවීම පිණිස සුදුසු දිරිගැන්වීමේ ක්‍රමවේදයක් කඩිනමින් හඳුන්වා දීමේ අවශ්‍යතාව නිලධාරි කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4.9 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම පිණිස රජයේ භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථාව කාලෝචිතව සංශෝධනය කිරීම:

දැනට රාජ්‍ය සේවයේ පුහුණු භාෂා පරිවර්තකයින්ගේ හිඟයක් පවතින අතර, එම හේතුව නිසා ඇතැම් රාජ්‍ය ආයතනවල භාෂා පරිවර්තන කටයුතු නියමිත ප්‍රමිතියෙන් තොරව සිදුවන බව පෙනී ගොස් ඇත. එසේම, ප්‍රමාණවත් පහසුකම් හා නිසි ඇගැයීමක් නොමැතිකම හේතුවෙන් දක්ෂ, ප්‍රවීණ භාෂා පරිවර්තකයින් රාජ්‍ය සේවයේ රඳවාගැනීම ගැටලුවක් වී ඇත. එබැවින්, මෙම ගැටලුවලට විසඳුම් ලැබෙන ආකාරයේ නව සේවා ව්‍යවස්ථාවක් භාෂා පරිවර්තක සේවය වෙනුවෙන් හඳුන්වාදීම කාලෝචිත පියවරක් වනු ඇත.

5. විද්වත් කමිටුව විසින් යෝජනා කරන ලද විෂය නිර්දේශ හා ඇගැයීම් ක්‍රමවේදය:

රාජ්‍ය නිලධාරින් විසින් අත් කරගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම හා ඇගැයීම පිණිස සුදුසු විෂය නිර්දේශ සහ ඇගැයීම් ක්‍රමවේදයක් සම්බන්ධයෙන් නිලධාරි කමිටුව හා විද්වත් කමිටුව අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව, විද්වත් කමිටුව විසින් පහත සඳහන් විෂය නිර්දේශ හා ඇගැයීම් ක්‍රමවේදය නිර්දේශ කරන ලදී. එසේම අංක: 07/2007 දරන චක්‍රලේඛයෙහි 3 වන කාණ්ඩයෙහි නිලධාරින් යළි වර්ගීකරණය කොට කනිෂ්ඨ නිලධාරින් සඳහා 4 වන කාණ්ඩය වශයෙන් අලුතින් කාණ්ඩයක් හඳුන්වාදීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ද, නිලධාරි කමිටුව හා විද්වත් කමිටුව විසින් එකඟ වන ලදී.

5.1 විද්වත් කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි, 1 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අවශ්‍ය රාජ්‍ය නිලධාරින් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) සම්බන්ධයෙන් ලබාගත යුතු ප්‍රවීණතාව:

5.1.1 ඉලක්කය:

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම පිණිස සිංහල හා දෙමළ භාෂා කථා කරන ජන කොටස් අතර සමාජ, සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා අගය කිරීම වර්ධනය කිරීම.

5.1.2 අරමුණු:

(අ) සංකීර්ණ පරිපාලනමය රාජකාරි ඉටු කිරීම පිණිස ඉලක්කගත භාෂාවේ ලිඛිත හා කථන භාෂා ස්වරූපයන්ගෙන් සන්නිවේදනය කිරීමට හැකියාව අත් කරගැනීම.

(ආ) පෙලඹවීම, ප්‍රශංසා කිරීම, ප්‍රතික්ෂේප කිරීම ආදී සංකීර්ණ භාෂාමය කාර්යයන් ඉටු කිරීම පිණිස භාෂාව මැනවින් උපයෝගී කර ගැනීමේ හැකියාව අත් කරගැනීම.

(ඇ) ඉලක්කගත භාෂාව කථා කරන්නන්ගේ සමාජ-සංස්කෘතික

වටිනාකම් ඇගයීමට හැකියාව අත් කරගැනීම.

(ඇ) විවිධ වූ ලේඛන ඉලක්කගත භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව අත් කරගැනීම.

5.1.3 ඉගෙනුම් ප්‍රතිඵලය:

පාඨමාලාව අවසානයේදී සංකීර්ණ පරිපාලනමය රාජකාරි ඉටු කිරීම පිණිස ඉලක්කගත භාෂාවේ ලිඛිත හා කථන භාෂා ස්වරූපයන්ගෙන් සන්නිවේදනය කිරීමට සංකීර්ණ භාෂාමය කාර්යයන් වන පෙලඹවීම, ප්‍රශංසා කිරීම, ප්‍රතික්ෂේප කිරීම ආදිය ඉටු කිරීම පිණිස භාෂාව මැනවින් උපයෝගි කරගැනීමට, ඉලක්කගත භාෂාව කථා කරන්නන්ගේ සමාජ-සංස්කෘතික වටිනාකම් ඇගැයීමට සහ ඉලක්කගත භාෂාවට ලේඛන පරිවර්තනය කිරීමට ශිෂ්‍යයාට හැකිවනු ඇත.

5.1.4 අන්තර්ගතය:

(අ) ශ්‍රවණ කුසලතා:

(i) විවිධ අවස්ථා හා සිද්ධිවලට අදාළ සංවාදයන්ට සවන් දී අවබෝධ කරගැනීම.

(ii) තම මූලිකත්වයෙන් පැවැත්වෙන රැස්වීම්, සාකච්ඡා ආදියට සවන් දී අවබෝධ කරගැනීම.

(iii) එදිනෙදා පැවැත්වෙන කථා හා මාධ්‍ය වැඩසටහන් ආදියට සවන් දී අවබෝධ කරගැනීම.

(iv) කථිකයන් පළ කරන හැඟීම් හා මතවලට සවන් දී ඒවායේ සියුම් අර්ථ අවබෝධ කරගැනීම.

(ආ) කථන කුසලතා:

(i) අදහස් හා හැඟීම් ක්‍රමානුකූලව හා අර්ථානුකූලව ප්‍රකාශ කිරීම.

(ii) විවිධ සමාජීය හා වෘත්තීයමය අවස්ථාවන්හිදී ආචාර සම්පන්නභාවය හා විවිධ ආමන්ත්‍රණ පිළිබඳ සම්ප්‍රදායන්ට අනුකූලව සංවාදයේ යෙදීම.

(iii) තම වෘත්තියට අදාළ මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු

කිරීම.

(iv) ව්‍යාකරණ, පද භාවිතය හා උච්චාරණය උපරිම නිවැරදි භාවයෙන් යුතුව කථා කිරීම.

(ඇ) කියවීමේ කුසලතා:

(i) එදිනෙදා කාර්යයන් හා සම්බන්ධ විවිධ ප්‍රකාශන කියවා අවබෝධ කරගැනීම.

(ii) තම වෘත්තියට අදාළ තාක්ෂණික හා විද්‍යාත්මක ලේඛන කියවා අවබෝධ කරගැනීම.

(ඈ) ලිවීමේ කුසලතා:

(i) මාධ්‍ය ප්‍රකාශ ඇතුළු විවිධ කාර්යාලයීය ලිපි හා ලේඛන ලිවීම.

(ii) කාර්යාලයීය හා දෛනික ලියවිලි සාරාංශගත කිරීම සහ භාවානුවාදය.

(iii) ලිඛිත භාෂාවේ සම්මතයන් ප්‍රශස්ත අයුරින් භාවිතයට ගැනීම.

(iv) භාෂාවේ ලිඛිත ස්වරූපයේ වාග් කෝෂය, ව්‍යාකරණ රීති හා ශෛලියට අනුකූලව ලිවීම.

(v) විවිධ කාර්යාලයීය හා දෛනික සටහන් මුල් භාෂාවෙන් ඉලක්කගත භාෂාවට ද ඉලක්කගත භාෂාවෙන් මුල් භාෂාවට ද පරිවර්තනය කිරීම.

(vi) වාචික ස්වරූපයේ සටහන් ලිඛිත ස්වරූපයට ද, ලිඛිත ස්වරූපයේ සටහන් වාචික ස්වරූපයට ද පරිවර්තනය කිරීම.

(ඉ) ඇගැයීම:

(i) **ලිඛිත පරීක්ෂණය:**

- **I වන ප්‍රශ්න පත්‍රය:** (පැය 02 යි - ලකුණු 20%) ව්‍යාකරණ හා වචන භාවිතය, අවබෝධය.
- **II වන ප්‍රශ්න පත්‍රය:** (පැය 02 යි - ලකුණු 50%)

ලිවීම, සාරාංශගත කිරීම, ලිපි ලිවීම, පරිවර්තනය

(ii) **වාචික පරීක්ෂණය:**

කියවීමේ, සවන්දීමේ හා කථා කිරීමේ කුසලතා පරීක්ෂා කෙරෙන විනාඩි 30 ක, 30% ක් ලකුණු හිමි වන පරීක්ෂණයකි. පහත සඳහන් පරිදි ලකුණු ලබා දෙනු ඇත.

කියවීම	:	05
සවන්දීම	:	10
කථා කිරීම	:	15

(ඊ) පාඨමාලා කාලය:

මෙම විෂය නිර්දේශයට අදාළ පාඨමාලාව පැය 300 කි.

5.2 විද්වත් කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි, 2 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අවශ්‍ය රාජ්‍ය නිලධාරින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) සම්බන්ධයෙන් ලබාගත යුතු ප්‍රවීණතාව:

5.2.1 ඉලක්කය:

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම පිණිස සිංහල හා දෙමළ භාෂා කථා කරන ජන කොටස් අතර සමාජ, සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා අගය කිරීම වර්ධනය කිරීම.

5.2.2 අරමුණු:

(අ) භාෂාවේ ලිඛිත හා කථන අංශ දෙකෙන්ම සාර්ථකව සන්නිවේදනය කිරීමට හැකියාව අත් කරගැනීම.

(ආ) තම වෘත්තියට අදාළ දෛනික පරිපාලන කාර්යයන්හි නියැළීමට හැකියාව අත් කරගැනීම.

(ඇ) ඵලදායී අයුරින් භාෂාව භාවිත කොට යහපත් මහජන සබඳතා ගොඩ නඟාගැනීමට හැකියාව අත් කරගැනීම.

(ඈ) භාෂාවේ ලිඛිත හා කථන මාධ්‍ය දෙකෙන්ම වාක්‍ය රචනය හා

පරිවර්තනය කිරීමේ හැකියාව අත් කරගැනීම.

5.2.3 ඉගෙනුම් ප්‍රතිඵලය:

පාඨමාලාව අවසානයේදී, භාෂාවේ ලිඛිත හා කථන යන අංශ දෙකෙන්ම සාර්ථකව සන්නිවේදනය කිරීමට, තම වෘත්තියට අදාළ දෛනික පරිපාලන කාර්යයන්හි නියැළීමට, ඵලදායී අයුරින් භාෂාව භාවිත කොට යහපත් මහජන සබඳතා ගොඩ නඟාගැනීමට සහ භාෂාවේ ලිඛිත හා කථන මාධ්‍ය දෙකෙන්ම වාක්‍ය රචනය හා පරිවර්තනය කිරීමට ශිෂ්‍යයාට හැකිවනු ඇත.

5.2.4 අන්තර්ගතය:

(අ) ශ්‍රවණ කුසලතා:

(i) තම වෘත්තිය හා සම්බන්ධ විවිධ අවස්ථා හා සිද්ධිවලට අදාළ සංවාදයන්ට සවන් දී අවබෝධ කරගැනීම.

(ii) තම වෘත්තියට අදාළ පුළුල් පරාසයක පැතිරුණු දැන්වීම්, නියෝග, විස්තර ප්‍රචාර ආදියට සවන් දී අවබෝධ කරගැනීම.

(iii) තම වෘත්තියට අදාළ විද්‍යුත් මාධ්‍යයන්ට සවන් දී අවබෝධ කරගැනීම.

(iv) තම වෘත්තියට අදාළ රැස්වීම්, සාකච්ඡා සැසිවාර හා දේශනවලට සවන් දී අවබෝධ කරගැනීම.

(ආ) කථන කුසලතා:

(i) සිද්ධි හා අවස්ථා, උච්චාරණය ද ඇතුළුව, නිවැරදිව විස්තර කිරීම.

(ii) තම මතයන්, එකඟතාවන් හා ප්‍රතිවිරුද්ධ අදහස් උචිත පරිදි ඉදිරිපත් කිරීම.

(iii) විවිධ අවස්ථා පරාසයක් තුළ, ඵලදායී අයුරින් සංවාදයන්හි නියැළීම.

(iv) පිළිගැනීමේ කථා හෝ ස්තුති කථා ආදී කෙටි දෙසුම් පැවැත්වීම.

(v) සමාජීය හමුවීම්වලදී තම අදහස් දැක්වීම හා අන් අයගේ

අදහස්වලට ප්‍රතිචාර දැක්වීම.

(ඇ) කියවීමේ කුසලතා:

(i) වෘත්තියට අදාළව අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි උච්චාරණය සමග හඬ නඟා කියවීම.

(ii) අත්අකුරින් ලියැවුණු ලියවිලි ඇතුළු රාජකාරි ලිපි, චක්‍රලේඛ හා ලියවිලි කියවා අවබෝධ කරගැනීම.

(iii) පුවත්පත් ලිපි කියවා අවබෝධ කරගැනීම.

(ඈ) ලිවීමේ කුසලතා:

(i) කාර්යාලයීය ලිපි, සන්දේශ ඇතුළු තම වෘත්තියට අදාළ ප්‍රායෝගික ලිවීමේ කාර්යයන්හි නියැළීම.

(ii) මූලික ව්‍යාකරණ රීති භාවිත කරමින් සරල වාක්‍ය ලිවීම.

(iii) කථන ස්වරූපයෙන් ඇති කෙටි පාඨයක් ලිඛිත ස්වරූපයට ද ලිඛිත ස්වරූපයේ පාඨයක් කථන ස්වරූපයට ද පරිවර්තනය කිරීම.

(iv) කෙටි ලේඛනයක් එක් භාෂාවකින් වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීම.

(ඉ) ඇගැයීම:

(i) **ලිඛිත පරීක්ෂණය** (ලකුණු 70%)

කියවීම හා ලිවීමේ කුසලතා පරීක්ෂා කිරීම සඳහා පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි. එය කොටස් දෙකකින් (02) සමන්විත වනු ඇත.

- 1 කොටස (ලකුණු 20%)
  සරල ව්‍යාකරණ හා වචන භාවිතය.

- 2 කොටස (ලකුණු 50%)
  අවබෝධය, වාක්‍ය රචනා, ලිපි, සාරාංශ,

(ii) **වාචික පරීක්ෂණය** (ලකුණු 30%)

කියවීමේ, සවන්දීමේ හා කථා කිරීමේ කුසලතා පරීක්ෂා කෙරෙන විනාඩි 30 ක පරීක්ෂණයකි. ඒ සඳහා පහත සඳහන් පරිදි ලකුණු හිමිවනු ඇත.

කියවීම	:	05
සවන්දීම	:	10
කථා කිරීම	:	15

(ඊ) පාඨමාලා කාලය:

මෙම විෂය නිර්දේශයට අදාළ පාඨමාලාව පැය 250 කි.

5.3 විද්වත් කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි, 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අවශ්‍ය රාජ්‍ය නිලධාරින් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) සම්බන්ධයෙන් ලබාගත යුතු ප්‍රවීණතාව:

5.3.1 ඉලක්කය:

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම පිණිස සිංහල හා දෙමළ භාෂා කථා කරන ජන කොටස් අතර සමාජ, සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා අගය කිරීම වර්ධනය කිරීම.

5.3.2 අරමුණු:

(අ) පෞද්ගලික හා රාජකාරි කටයුතුවලදී එදිනෙදා සරල සංවාදවල යෙදීම පිණිස කථන හා ශ්‍රවණ කුසලතා වර්ධනය කිරීම.

(ආ) පෞද්ගලික හා කාර්යාලයීය කෙටි සටහන් කියවීම පිණිස කියවීමේ කුසලතා වර්ධනය කිරීම.

(ඇ) කෙටි ලේඛන සකස් කිරීමට හැකිවනු පිණිස ලිවීමේ කුසලතා වර්ධනය කිරීම.

5.3.3 ඉගෙනුම් ප්‍රතිඵලය:

පාඨමාලාව අවසානයේදී පෞද්ගලික හා රාජකාරි කටයුතුවලදී එදිනෙදා සරල සංවාදවල නියැළීමට, පෞද්ගලික හා කාර්යාලයීය කෙටි සටහන් කියවීමට සහ කෙටි සටහන් ලිවීමට ශිෂ්‍යයාට හැකිවනු ඇත.

5.3.4 අන්තර්ගතය:

(අ) ශ්‍රවණ කුසලතා:

(i) කෙටි පැහැදිලි කිරීම් හා කරුණු දැක්වීම්වලට සවන් දී අවබෝධ කරගැනීම.

(ii) පොදු විස්තර ප්‍රචාර, උපදෙස් හා දුරකථන පණිවුඩ ඇතුළු පණිවුඩවලට සවන් දී අවබෝධ කරගැනීම.

(iii) සරල සංවාදවලට සවන් දී අවබෝධ කරගැනීම.

(ආ) කථන කුසලතා:

(i) යෝග්‍ය වචන භාවිත කොට, තම රැකියාවට අදාළ කරුණු විස්තර කිරීම හා පැහැදිලි කිරීම.

(ii) විවිධ පෞද්ගලික සංවාදවල නියැළීම.

(iii) සිය රැකියාවට අදාළ සාකච්ඡා කටයුතුවල නියැළීම.

(ඇ) කියවීමේ කුසලතා:

(i) දැන්වීම් හා උපදෙස් කියවීම.

(ii) අවිධිමත් භාෂාවෙන් ලියවුණු කෙටි ලේඛන කියවීම.

(ඈ) ලිවීමේ කුසලතා:

(i) නිවැරදි ස්වරූපයෙන් හා ප්‍රමාණයෙන් අකුරු ලිවීම.

(ii) ආකෘති පත්‍ර පිරවීම.

(iii) පණිවුඩ, දැන්වීම් හා උපදෙස් ආදිය කථන භාෂා

ස්වරූපයෙන් ලිවීම.

(ඉ) ඇගැයීම:

ඇගැයීම කථන සහ ලිඛිත වශයෙන් කොටස් දෙකකින් (02) සමන්විත වේ.

(i) **කථන පරීක්ෂණය:**

මෙම පරීක්ෂණය සඳහා 60% ක් ලකුණු ලබාදෙනු ඇත. එය කියවීමේ, සවන්දීමේ හා කථා කිරීමේ කුසලතා ඇතුළත් විනාඩි 30 ක කාලයක් සඳහා වන පරීක්ෂණයකි.

(ii) **ලිඛිත පරීක්ෂණය:**

මෙම පරීක්ෂණය සඳහා 40% ලකුණු ලබාදෙන අතර, එය ලිවීමේ කුසලතා පරීක්ෂා කරනු ලබන පැය තුනක (03) ප්‍රශ්න පත්‍රයකි.

(ඊ) පාඨමාලා කාලය:

මෙම විෂය නිර්දේශයට අදාළ පාඨමාලාව පැය 150 කි.

5.4 විද්වත් කමිටුව විසින් නිර්දේශ කරන ලද පරිදි ,4 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අවශ්‍ය රාජ්‍ය නිලධාරින් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) සම්බන්ධයෙන් ලබාගත යුතු වන ප්‍රවීණතාව:

5.4.1 ඉලක්කය:

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම පිණිස සිංහල හා දෙමළ භාෂා කථා කරන ජන කොටස් අතර සමාජ, සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා අගය කිරීම වර්ධනය කිරීම.

5.4.2 අරමුණු:

(අ) එදිනෙදා සරල සංවාදවල යෙදීම පිණිස කථන හා ශ්‍රවණ කුසලතා වර්ධනය කිරීම.

(ආ) පුද්ගල හා ස්ථාන නාම කියවීම පිණිස කියවීමේ කුසලතා වර්ධනය කිරීම.

(ඇ) නම් හා ලිපිනයන් ලිවීමට හැකිවනු පිණිස ලිවීමේ කුසලතා වර්ධනය කිරීම.

5.4.3 ඉගෙනුම් ප්‍රතිඵලය:

පාඨමාලාව අවසානයේදී එදිනෙදා සරල සංවාදයක නියැළීමට, පුද්ගල හා ස්ථාන නාම කියවීමට සහ නම් හා ලිපිනයන් ලිවීමට ශිෂ්‍යයාට හැකිවනු ඇත.

5.4.4 අන්තර්ගතය:

(අ) ශ්‍රවණ කුසලතා:

සරල නිවේදන, උපදෙස්, පණිවුඩ සහ කාර්යාලය තුළ හා ඉන් බැහැර සිදු කරන සරල කතාබහ සහ සරල සංවාද අවබෝධ කරගැනීම.

(ආ) කථන කුසලතා:

(i) පුද්ගලයන් හමුවීම හා සුබ පැතීම.

(ii) සරල කතාබහක නියැළීම.

(iii) සරල උපදෙස් ලබාදීම.

(iv) කාර්යාලය තුළ හා ඉන් බැහැරව කෙටි සංවාදවල නියැළීම.

(v) දුරකථන ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීම.

(vi) ගණන් කිරීම, මාසවල නම් සහ සතියේ දිනයන් නම් කිරීම.

(ඇ) කියවීමේ කුසලතා:

(i) මාර්ග සංඥා, නාම පුවරු, දැන්වීම් පුවරු මත පළ වන උපදෙස් කියවීම.

(ii) පුවත්පත්වල නම් කියවීම.

(iii) ලිපිකවරයන්හි සඳහන් නම් හා ලිපිනයන් කියවීම.

(iv) පුද්ගල, ස්ථාන, තනතුරු නාම කියවීම.

(ඇ) ලිවීමේ කුසලතා:

(i) නිවැරදි ස්වරූපයෙන් හා ප්‍රමාණයෙන් අකුරු ලිවීම.

(ii) කෙටි වචන ලිවීම.

(iii) තම නම හා ලිපිනය ලිවීම.

(iv) ස්ථාන හා භාණ්ඩ නාම ලිවීම.

(ඉ) ඇගැයීම:

ඇගැයීම කථන සහ ලිඛිත වශයෙන් කොටස් දෙකකින් (02) සමන්විත වේ.

(i) **කථන පරීක්ෂණය:**

කථන පරීක්ෂණය සඳහා ලකුණු 60% ක් වන අතර, එය කථනය සඳහා විනාඩි 20 කින් ද, ශ්‍රවණය සඳහා විනාඩි 10 කින් ද සමන්විත, විනාඩි 30ක පරීක්ෂණයකි.

(ii) **ලිඛිත පරීක්ෂණය:**

ලිඛිත පරීක්ෂණය කියවීම හා ලිවීම පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ලකුණු 40%ක් ලැබෙන පරීක්ෂණයකි.

(ඊ) පාඨමාලා කාලය:

මෙම විෂය නිර්දේශයට අදාළ පාඨමාලාව පැය 100 කි.

5.5 ශ්‍රේණිගත කිරීම:

සියලුම කාණ්ඩ සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදී සාධන මට්ටම පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කළ යුතු වේ .

විශිෂ්ට සම්මාන	75	-	100
අධි සම්මාන	65	-	74
සම්මාන	50	-	64

සමත්	40	-	49
අසමත්	0	-	39

5.6 පරීක්ෂණයෙන් සමත්වීම:

පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා වාචික හා ලිඛිත යන පරීක්ෂණ දෙකටම ඉදිරිපත්වීම අනිවාර්ය වේ. සමස්ත පරීක්ෂණයෙන් සමත්වීම පිණිස අයදුම්කරුවකු විසින් විභාගයේ වාචික හා ලිඛිත යන අංශ දෙකෙන්ම යටත් පිරිසෙයින් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

6. විද්වත් කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන එක් එක් කාණ්ඩයේ සේවාවන්/තනතුරු සඳහා නිලධාරි කමිටුව විසින් නිර්දේශ කරනු ලබන ප්‍රවීණතාවන් :

ඉහත 5.1, 5.2, 5.3, 5.4, 5.5 සහ 5.6 යටතේ යෝජිත විෂය නිර්දේශ හා අධ්‍යයන ක්‍රමවේදය ඒ ඒ සේවාවන්ගේ පරිපාලන බලධාරින්, වෘත්තීය සමිති නියෝජිතයන් හා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන් සමග ගැඹුරින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එක් එක් සේවාවන්/තනතුරු කාණ්ඩ සඳහා, නිලධාරි කමිටුව විසින් යෝජනා කරනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පහත දැක්වේ:

6.1 1 වන කාණ්ඩයේ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :

අධීක්ෂණ හා පරිපාලනමය රාජකාරි ඉටු කිරීමේදී, තම යටත් නිලධාරින් හා සේවාලාභීන් විසින් අනෙක් රාජ්‍ය භාෂාවෙන් වාචිකව හා ලිඛිතව ඉදිරිපත් කරන දෑ සම්බන්ධයෙන් නිවැරදි තීරණ ගැනීම පිණිස, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඵලදායී අන්දමින් ඉටු කිරීම සඳහා තිබිය යුතු ප්‍රවීණතාව මෙම කාණ්ඩයේ නිලධාරින්ට අදාළ විය යුතුය.

(i) තම රාජකාරි කටයුතුවලදී අනෙක් රාජ්‍ය භාෂාවෙන් ලිඛිතව හා වාචිකව නිවැරදිව සන්නිවේදනය කිරීම.

(ii) යම් යම් කරුණු ඒත්තු ගැන්වීම.

(iii) දිරිගැන්වීම, ප්‍රශංසා කිරීම සහ අදහස් විමසීම වැනි සංකීර්ණ කාර්යයන් ඉටු කිරීම පිණිස අදාළ අනෙක් රාජ්‍ය භාෂාව මැනවින් උපයෝගී කරගැනීම.

(iv) අදාළ අනෙක් රාජ්‍ය භාෂාව කථා කරන්නන්ගේ සමාජ-සංස්කෘතික වටිනාකම් ඇගැයීම.

(v) සාකච්ඡා සටහන් ආදී තාක්ෂණික නොවන, දීර්ඝ නොවූ ලේඛන අදාළ අනෙක් රාජ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කිරීමට හැකිවීම.

6.2 2 වන කාණ්ඩයේ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණතාව:

මෙම කාණ්ඩය යටතේ වන සේවාවන්/තනතුරුවලින් පහත සඳහන් කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා වන ප්‍රවීණතාව ලබාගැනීම අපේක්ෂා කෙරේ:

(i) තම රාජකාරි ඉටු කිරීමේදී හා සේවා ලබාදීමේදී ලිඛිත හා වාචික යන අංශ දෙකෙන්ම, අනෙක් රාජ්‍ය භාෂාවෙන් සාර්ථකව සන්නිවේදනය කිරීම.

(ii) තම තනතුරට අදාළ දෛනික වෘත්තීයමය හා පරිපාලන කාර්යයන්හි නියැළීමේදී ඵලදායී අයුරින් අනෙක් රාජ්‍ය භාෂාව භාවිත කොට යහපත් මහජන සම්බන්ධතා ගොඩ නඟාගැනීම.

(iii) අනෙක් රාජ්‍ය භාෂාවෙන් තාක්ෂණික නොවන සාමාන්‍ය වාර්තා ආදිය ලිවීමට හා ඉදිරිපත් කිරීමට හැකිවීම.

(iv) සාර්ථක ලෙස අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීම සඳහා අනෙක් රාජ්‍ය භාෂාව යොදා ගැනීමේ හැකියාව තිබීම.

6.3 3 වන කාණ්ඩයේ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණතාව:

මෙම කාණ්ඩය යටතේ වන සේවාවන්/තනතුරුවලින් පහත සඳහන් කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රවීණතාව ලබාගැනීම අපේක්ෂා කෙරේ:

(i) තම තනතුරට අදාළව එදිනෙදා කෙරෙන වෘත්තීයමය හා පරිපාලන කටයුතුවලදී සරල සංවාදවල නියැළීමට හැකිවීම.

(ii) කාර්යාලයීය කෙටි සටහන් කියවීමට සහ කෙටි සටහන් ලිවීමට හැකිවීම.

(iii) සතුටුදායක ලෙස අන්තර් පුද්ගල සබඳතා පවත්වාගැනීමේ හැකියාව.

6.4 4 වන කාණ්ඩයේ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණතාව:

මෙම කාණ්ඩය යටතේ වන සේවාවන්/තනතුරුවලින් පහත සඳහන් කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රවීණතාව අපේක්ෂා කෙරේ:

(i) සේවාලාභීන් සුහදව පිළිගැනීම.

(ii) අනෙක් රාජ්‍ය භාෂාවෙන් සරල සංවාදයක නියැළීමට හැකිවීම.

(iii) පුද්ගල හා ස්ථාන නාම කියවීමට සහ නම් හා ලිපිනයන් ලිවීමට හැකිවීම.

(iv) අනෙක් රාජ්‍ය භාෂාවෙන් කටයුතු කරනු ලබන සේවාලාභියකු, නිලධාරියෙක් වෙත හෝ නියමිත ස්ථානයක් වෙත යොමු කිරීමේ හැකියාව.

7. රාජ්‍ය නිලධාරීන් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව හැර අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් වන ප්‍රවීණතාව ලබා ගැනීමේ දී අදාළ වන ප්‍රවීණතා මට්ටම් දැක්වෙන සටහන

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
(1)	07/2007 චක්‍රලේඛයේ 1 වන කාණ්ඩය යටතේ දැක්වෙන සේවාවන්/ තනතුරු: ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය, දේශීය ආදායම් සේවය, ශ්‍රී ලංකා තක්සේරු සේවය, ශ්‍රී ලංකා විගණන සේවය, අධිකරණ නිලධාරීන්, ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරි හා ඊට ඉහළ ශ්‍රේණි, නීති නිලධාරීන්, ශ්‍රී ලංකා විදේශ සේවය, ශ්‍රී ලංකා රේගු සේවය, දීපව්‍යාප්ත සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත සේවාවල නිරත මාණ්ඩලික ශ්‍රේණිවල නිලධාරීන්, ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, විදුහල්පති සේවය.	(i) I වන තීරුවෙහි 1 වන කාණ්ඩය ලෙස දැක්වෙන සේවාවන්/තනතුරු නොවෙනස්ව පැවතිය යුතු අතර, එම සේවාවන්/තනතුරු සඳහා මෙම වාර්තාවේ 6.1 යටතේ දක්වා ඇති 1 කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම. (ii) සේවා අවශ්‍යතා සලකා බලා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් තීරණය කරනු ලබන වෙනත් සේවාවන්/තනතුරු ද මෙම කාණ්ඩය යටතට ඇතුළත් කිරීම.	(i) ඉහළ වගකීමකින් යුතු රාජකාරි ඉටු කිරීමේදී තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව කථා කරන්නන්ගේ සමාජ-සංස්කෘතික වටිනාකම් සුරකිමින් එකී භාෂාවෙන් නිවැරදිව, ලිඛිතව හා වාචිකව සන්නිවේදනය කිරීම; (ii) තම තනතුරට අදාළ දෛනික වෘත්තියමය/පරිපාලනමය කාර්යයන්හි නියැළීමේදී, අවශ්‍ය අවස්ථාවන්හිදී ඇතැම් ඉල්ලීම් හේතු දක්වමින් ප්‍රතික්ෂේප කිරීම, තම තීරණය සේවාලාභීන්ට ඒත්තු ගැන්වීම, තම කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම, ඔවුන්ට ප්‍රශංසා කිරීම සහ ඔවුන්ගේ අදහස් විමසීම වැනි සංකීර්ණ කාර්යයන් ඉටුකිරීම පිණිස භාෂාව මැනවින් උපයෝගී කරගැනීම; (iii) සාකච්ඡා සටහන් ආදී, තාක්ෂණික නොවන දීර්ඝ නොවූ ලේඛන සැකසීම.	(i) 1 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත්වීම. (ii) අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබීම ලිඛිත පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමකි. (iii) නිලධාරියා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයක පිහිටි[මෙම වාර්තාවේ නිර්දේශ 8.1.1. (උ) පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක එක් (01) වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සක්‍රියව සේවය කිරීම, වාචික පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමක් වනු ඇත.

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරින් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
(2)	**07/2007 චක්‍රලේඛයේ 2වන කාණ්ඩය යටතේ දැක්වෙන සේවාවන්/තනතුරු:** රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හා ඒ හා සමාන දෙපාර්තමේන්තුගත සේවාවන්, පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින්, ග්‍රාම නිලධාරින්, ව්‍යාප්ති සේවාවල නියුතු සියලුම ක්ෂේත්‍ර නිලධාරින් (තාක්ෂණ සේවාව වැනි සේවාවන්), මහජන සෞඛ්‍ය පරීක්ෂක, පිළිගැනීමේ නිලධාරි, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය, පවුල් සෞඛ්‍ය සේවය.	(i) I වන තීරුවෙහි 2 වන කාණ්ඩය ලෙස දැක්වෙන සේවාවන්/තනතුරු අතුරින් පවුල් සෞඛ්‍ය සේවය හැරුණු කොට අනෙකුත් සේවාවන්/තනතුරු තවදුරටත් එම 2 වන කාණ්ඩය යටතේම වර්ග කිරීම හා එම සේවාවන්/තනතුරු සඳහා මෙම වාර්තාවේ 6.2 යටතේ දක්වා ඇති 2 වන කාණ්ඩයේ ප්‍රවීණතාව ඔවුනට අදාළ කිරීම. (ii) I වන තීරුවේ දැක්වෙන පවුල් සෞඛ්‍ය සේවය 2 වන කාණ්ඩයෙන් ඉවත් කොට එම සේවාව 3 වන කාණ්ඩය යටතට ඇතුළත් කිරීම. (iii) I වන තීරුවේ දැක්වෙන 3 වන කාණ්ඩය යටතේ වර්ග කර ඇති පුස්තකාලයාධිපති සේවය මෙම වාර්තාවේ 4.3.1 හි දක්වා ඇති නිරීක්ෂණ පදනම් කරගෙන 2 වන කාණ්ඩයට අයත් සේවාවන්/තනතුරු අතරට ඇතුළත් කිරීම සහ මෙම වාර්තාවේ 6.2 යටතේ දක්වා ඇති 2 වන කාණ්ඩයේ ප්‍රවීණතාව එම සේවාවට අදාළ කිරීම; (iv) සේවා අවශ්‍යතා සලකා බලා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් තීරණය කරනු ලබන වෙනත් සේවාවන්/තනතුරු සඳහා 2 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම.	(i) තම තනතුරට අදාළ එදිනෙදා රාජකාරි ඉටුකිරීමේදී ලිඛිත හා කථන යන අංශ දෙකෙන්ම සාර්ථකව සන්නිවේදනය කිරීම; (ii) ඵලදායී අයුරින් භාෂාව භාවිත කරමින් යහපත් මහජන සබඳතා ගොඩනගා ගැනීමට සහ සාර්ථක ලෙස මහජන සබඳතා පවත්වා ගැනීමට හැකිවීම; (iii) තාක්ෂණික නොවන සාමාන්‍ය වාර්තා ආදිය ලිවීමට හා වාචිකව ඉදිරිපත් කිරීමට හැකිවීම.	(i) 2 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත්වීම. (ii) අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබීම ලිඛිත පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමකි. (iii) නිලධාරියා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයක පිහිටි [මෙම වාර්තාවේ නිර්දේශ 8.1.1 (උ) පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක එක් (01) වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සක්‍රියව සේවය කිරීම, වාචික පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමක් වනු ඇත.

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරින් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
(3)	**07/2007 චක්‍රලේඛයේ 3වන කාණ්ඩය යටතේ දැක්වෙන <u>සේවාවන්/තනතුරු</u>:** ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, රජයේ වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින්, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය, හෙද සේවය, පුස්තකාලයාධිපති සේවය, කනිෂ්ඨ කාර්යමණ්ඩල.	(i) I වන තීරුවෙහි දැක්වෙන සේවාවන්/ තනතුරු අතරෙන් පුස්තකාලයාධිපති සේවය හා කනිෂ්ඨ කාර්යමණ්ඩල හැරුණු කොට අනෙක් සේවාවන්/තනතුරු තවදුරටත් එම 3 වන කාණ්ඩය යටතේම වර්ග කිරීම හා එම සේවාවන්/තනතුරු සඳහා මෙම වාර්තාවේ 6.3 යටතේ දක්වා ඇති 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කරගැනීම. (ii) I වන තීරුවෙහි දැක්වෙන පුස්තකාල-යාධිපති සේවය 3 වන කාණ්ඩයෙන් ඉවත් කොට එය 2 වන කාණ්ඩය යටතට ඇතුළත් කිරීම හා එම සේවය සඳහා මෙම වාර්තාවේ 6.2 යටතේ වන 2 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම. (iii) අංක: 07/2007 චක්‍රලේඛයේ 2වන කාණ්ඩය යටතේ දක්වා ඇති පවුල් සෞඛ්‍ය සේවාව මෙම කාණ්ඩය යටතට (3 වන කාණ්ඩය) ඇතුළත් කිරීම සහ එම සේවය සඳහා මෙම වාර්තාවේ 6.3 යටතේ වන 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම. (iV) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය මෙම කාණ්ඩය යටතට (3වන කාණ්ඩය) ඇතුළත් කිරීම හා එම සේවාවන් සඳහා මෙම වාර්තාවේ 6.3 යටතේ දක්වා ඇති 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම.	(i) සිය එදිනෙදා රාජකාරි කටයුතුවලදී සරල සංවාදවල නියැළීමට හැකිවීම; (ii) කාර්යාලයීය කෙටි සටහන් කියවීමට සහ කෙටි සටහන් ලිවීමට හැකිවීම; (iii) සතුටුදායක ලෙස මහජන සබඳතා පවත්වා ගැනීමට හැකිවීම.	(i) 3 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය. හෝ (ii) තමන් සේවයට බැඳුණු අවස්ථාවේදී බලපැවැත්වුණු සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන ප්‍රකාරව, අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාවන් සපුරා තිබීම. හෝ (iii) සේවාරම්භක පුහුණුවේ කොටසක් වශයෙන් මෙම වාර්තාවේ 5.3 යටතේ දක්වා ඇති විෂය නිර්දේශයට අනුකූලව, අවම වශයෙන් පැය 150 ක කාලයක් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව/ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් හෝ එකී ආයතනවල අධීක්ෂණය යටතේ හෝ පවත්වනු ලබන සිංහල/දෙමළ භාෂාව පිළිබඳ පාඨමාලාවක් හදාරා එය අවසානයේදී පැවැත්වෙන ලිඛිත හා වාචික පරීක්ෂණයන්ගෙන් සමත්වීම;

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරින් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
		(v) වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට හා අතුරු වෛද්‍ය සේවාවට අයත් තනතුරු සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST/2/POLCY/03/ 0792 හා 2012-04-30 දිනැති ලිපියෙන් නියම කර ඇති 2වන මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව වෙනුවට ඔවුන් සඳහා මෙම වාර්තාවේ 6.3 යටතේ දක්වා ඇති 3වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම. (vi) I වන තීරුවෙහි 3 වන කාණ්ඩය යටතේ දැක්වෙන කනිෂ්ඨ කාර්යමණ්ඩලවලට අයත් නිලධාරින්, 2 වන තීරුවෙහි දක්වා ඇති පරිදි 4 වන කාණ්ඩය වශයෙන් අලුතින් වර්ග කිරීම සහ මෙම වාර්තාවේ 6.4 යටතේ දක්වා ඇති 4වන කාණ්ඩයේ ප්‍රවීණතාව ඔවුන් සඳහා අදාළ කිරීම. (vii) සේවා අවශ්‍යතා සලකා බලා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් තීරණය කරනු ලබන වෙනත් සේවාවන්/ තනතුරු සඳහා 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම.		(iv) අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබීම ඉහත සඳහන් ලිඛිත පරීක්ෂණයන් සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමකි. (v) නිලධාරියා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයක පිහිටි[මෙම වාර්තාවේ නිර්දේශ 8.1.1. (ළ) පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක එක් (01) වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සක්‍රීයව සේවය කිරීම, වාචික පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමක් වනු ඇත.

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරින් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
		යෝජිත 4 වන කාණ්ඩය සඳහා නිර්දේශ කෙරෙන නව ප්‍රවීණතා මට්ටම.		
(4)		(i) අංක: 06/2006 දරන රා.පරි. චක්‍රලේඛයෙහි ඇමුණුම I හි දැක්වෙන ප්‍රාථමික මට්ටමට අයත් වන ශිල්පීය නොවන තනතුරු වන කාර්යාල සේවක සේවය, ශ්‍රී ලංකා මැනුම් සහායක සේවය; අර්ධ ශිල්පීය තනතුරු වන අධිකරණ පොත් බැඳුම්කරු; ශිල්පීය තනතුරු වන මෝටර් රථ රියැදුරු වැනි තනතුරු සඳහා මෙම වාර්තාවේ 6.4 යටතේ දක්වා ඇති 4වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම. (ii) සේවා අවශ්‍යතා සලකා බලා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් තීරණය කරනු ලබන වෙනත් සේවාවන්/තනතුරු මෙම කාණ්ඩය යටතේ වර්ග කිරීම සහ එම සේවාවන්/තනතුරු සඳහා මෙම වාර්තාවේ 6.4 යටතේ දක්වා ඇති 4 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අදාළ කිරීම.	(i) සේවාලාභීන්/නිලධාරින් සුහදව හා උචිත ආමන්ත්‍රණයෙන් යුතුව පිළිගැනීමට හැකිවීම; (ii) සේවාලාභීන් සමග සරල සංවාදයක නියැළීමට හැකිවීම; (iii) පුද්ගල හා ස්ථාන නාම කියවීමට සහ නම් හා ලිපිනයන් ලිවීමට හැකිවීම; (iv) අනෙක් රාජ්‍ය භාෂාවෙන් කටයුතු කරන සේවාලාභියෙකු, නිලධාරියකු වෙත හෝ නියමිත ස්ථානයක් වෙත හෝ යොමු කිරීමට හැකියාව.	(i) 4 වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය. හෝ (ii) රාජ්‍ය සේවා පුහුණු ආයතනය හෝ පළාත් සභාවක් විසින් පාලනය කරනු ලබන පුහුණු ආයතනයක් විසින්, රාජ්‍ය භාෂා දෙපාර්ත-මේන්තුවේ මඟපෙන්වීම යටතේ, මෙම වාර්තාවේ 5.4 හි දැක්වෙන විෂය නිර්දේශයට අනුකූලව, අවම වශයෙන් පැය 100 ක කාලයක් තුළ පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳ පාඨමාලාවකට සහභාගිවීමෙන් අනතුරුව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම මත, පවත්වනු ලබන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත්වීම. (iii) අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/ දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමර්ථයක් ලබා තිබීම ඉහත සඳහන් ලිඛිත පරීක්ෂණයන් සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමකි.

	I වන තීරුව අංක: 07/2007 දරන රා.පරි. චක්‍රලේඛය අනුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ද ප්‍රවීණතාව ලබාගැනීම අදාළ වන සේවාවන්/තනතුරු	II වන තීරුව I වන තීරුවට කමිටුව විසින් යෝජනා කෙරෙන සංශෝධන	III වන තීරුව තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ නිලධාරින් විසින් අත් කරගත යුතුයයි යෝජනා කෙරෙන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව	IV වන තීරුව අදාළ ප්‍රවීණතාව මැන බැලීමට යෝජිත ක්‍රමවේදය
				(iv) නිලධාරියා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයක පිහිටි [මෙම වාර්තාවේ නිර්දේශ 8.1.1(උ) පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක එක් (01) වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සක්‍රියව සේවය කිරීම, වාචික පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමක් වනු ඇත.

8. කමිටුවේ නිර්දේශ:

8.1 පහත සඳහන් විධිවිධාන ඇතුළත් කරමින් අංක: 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය වෙනුවට නව චක්‍රලේඛයක් නිකුත් කිරීම:

මෙම වාර්තාවේ අංක 7 යටතේ දැක්වෙන වගුවේ යෝජිත පරිදි:

8.1.1 (අ) රාජ්‍ය භාෂා ප්‍රවීණතාවට අදාළව සේවාවන්/තනතුරු වර්ගීකරණය සම්බන්ධයෙන් දැනට තිබෙන විධිවිධාන, එම වගුවේ II වන තීරුවේ දැක්වෙන පරිදි සංශෝධනය කිරීම.

(ආ) එම වගුවේ II වන තීරුවේ දැක්වෙන එක් එක් සේවාවන්/ තනතුරු කණ්ඩායම විසින් එහි III වන තීරුවේ දක්වා ඇති තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව අත් කරගත යුතු බව නියම කිරීම.

(ඇ) එම වගුවේ II වන තීරුවේ දැක්වෙන එක් එක් සේවාවන්/ තනතුරු කණ්ඩායම් විසින් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රමාණවත් ප්‍රවීණතාව ලබා ඇත්දැයි පරීක්ෂා කිරීම හා ඇගැයීම සඳහා එහි IV වන තීරුවේ යෝජිත ක්‍රමවේදය පිළිගැනීම.

(ඈ) එම වගුවේ III වන තීරුවේ දැක්වෙන ප්‍රවීණතාව පරීක්ෂා කිරීම හා ඇගයීම සඳහා එහි IV වන තීරුවේ දැක්වෙන යෝජිත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම පිණිස මෙම වාර්තාවේ අංක 5 යටතේ දක්වා ඇති විද්වත් කමිටුව විසින් නිර්දේශ කරන ලද විෂය නිර්දේශ අදාළ කරගැනීම.

(ඉ) එම වගුවේ I වන තීරුවේ (3) යටතේ දැක්වෙන 3 වන කාණ්ඩයේ සේවාවන්/තනතුරුවලට අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම හා ඇගැයීම පිණිස එහි IV වන තීරුවේ (ii) යටතේ යෝජනා කර ඇති සුදුසුකම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය සඳහා රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා විසින්

නම් කරනු ලබන නිලධාරියකුගේ සේවය, ඉදිරියේදී එම සුදුසුකම පරීක්ෂා කරන අවස්ථාවන්හිදී ලබාගැනීම අනිවාර්ය කිරීම.

(ඊ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය ද රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු සේවාවන් වශයෙන් කමිටුව විසින් යෝජනා කර ඇති බැවින් එම සේවාවන් සඳහා ද පහත සඳහන් පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම අදාළ කිරීම:

(i) 2007-07-01 දින සිට 2013-06-30 දින දක්වා කාලය තුළ රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බැඳුණු/බැඳෙන නිලධාරින් 2013-07-01 දින සිට වසර පහක් (05) ඇතුළත තම සේවාවට අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු බව.

(ii) 2013-07-01 දින හෝ ඊට පසුව රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බැඳෙන නිලධාරින් ඔවුන් සේවයට බැඳුණු දින සිට වසර පහක් (05) ඇතුළත තම සේවාවට අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු බව.

(උ) යම් රාජ්‍ය නිලධාරියකුට තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේ ද යන්න හඳුනාගත හැකිවන පරිදි, එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලැයිස්තුවක් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විමසා පිළියෙල කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දීම.

(ඌ) ඉහත 8.1.1 (අ) සිට (ඊ) (i) දක්වා ඇති නිර්දේශ 2007-07-01 දින හෝ ඊට පසුව රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බැඳුණු නිලධාරින්ට සහ මින් ඉදිරියට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බැඳෙන නිලධාරින් සඳහා අදාළ කිරීම.

(එ) මෙම වාර්තාවේ අංක 4 යටතේ දැක්වෙන කරුණු සැලකිල්ලට ගනිමින් ඉහත (ඊ) (i) හි සඳහන් නිලධාරින් හැර, 2007-07-01 දින සිට 2010-06-30 දින දක්වා රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ නිලධාරින් සඳහා නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත් කරගැනීම පිණිස 2012-05-23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලබා දී ඇති සහන කාලයට අතිරේකව තවදුරටත් එක් (01) වර්ෂයක සහන කාලයක් ලබා දීම.

(ඒ) ඉහත (ඊ) (i) හි සඳහන් නිලධාරින් හැර, 2010-06-30 දිනෙන් පසුව රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බැඳුණු හා ඉදිරියේදී රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවාගනු ලබන නිලධාරින් විසින් ඔවුන්ට නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම සේවයට බැඳුණු දින සිට වසර පහක් (05) තුළ අත් කරගත යුතු අතර, එම අවශ්‍යතාව සම්පූර්ණ නොකරන නිලධාරින්ගේ වැටුප් වර්ධක එකී භාෂා ප්‍රවීණතා මට්ටම අත් කරගන්නා තුරු නතර කිරීම.

8.1.2 දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරින් සීමිත/කුසලතා පදනමින් ඉහළ තනතුරු සඳහා පත්වීම් ලබාගැනීමේදී, එකී ඉහළ තනතුරට අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කරගත යුතු බව.

8.1.3 සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජ්‍ය සේවයට බැඳෙන නිලධාරින් සම්බන්ධයෙන් අදාළ කරගත යුතු විධිවිධාන:

(අ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු රජයේ නිලධරයකු විසින් එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව මව්බස මට්ටමින් සහ අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව දෙවන බස මට්ටමින් ලබා ගත යුතු වේ.

(ආ) තමන් මව්බස මට්ටමින් ප්‍රවීණතාව ලබා ගන්නේ කුමන රාජ්‍ය භාෂාවෙන් ද යන්න නිලධාරියාගේ මනාපය පරිදි තීරණය කළ හැකිය. මව්බස මට්ටමේ ප්‍රවීණතාව සේවයට බැඳී අවුරුදු තුනක් (03)ක් ඇතුළත ලබා ගත යුතු අතර, දෙවන බස

මට්ටමේ ප්‍රවීණතාව සේවයට බැඳී අවුරුදු පහක් (05) තුළ ලබාගත යුතු වේ.

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයකු විසින් තමන් සේවයට ඇතුළත් වීමට පෙර හෝ සේවය අතරතුරදී හෝ අ.පො.ස. (සා.පෙළ) සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍යය විෂය සමත් වී ඇත්නම්, එම රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් මව්බස මට්ටමේ ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාව නිලධරයා විසින් සම්පූර්ණ කර ඇති බවට සැලකිය හැකිය.

(ඈ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයකු තමන් සේවයට ඇතුළත් වීමට පෙර හෝ සේවය අතරතුරදී හෝ අ.පො.ස. (සා.පෙළ) සිංහල/දෙමළ (දෙවන බස) විෂය සමත් වී ඇත්නම්, එම නිලධරයා විසින් දෙවන බස මට්ටමින් සමත් විය යුතු රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් අදාළ වන ලිඛිත පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට සැලකිය හැකිය.

8.2 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පිණිස රජයේ නිලධාරින්ට පහත සඳහන් පහසුකම් කඩිනමින් සැලසීම:

(අ) රජයේ නිලධාරින්ගේ රාජ්‍ය භාෂා කුසලතාව වර්ධනය කරගැනීම සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද පෙළපොත් ප්‍රමාණවත් පරිදි ප්‍රකාශයට පත්වී නොමැතිවීම හා අදාළ නිලධාරින් හැම දෙනාටම පූර්ණකාලීන විධිමත් පාඨමාලාවන්ට සහභාගිවීමට ඇති අපහසුතාවන් සැලකිල්ලට ගෙන, ස්වයංඅධ්‍යයනය පහසු කිරීම පිණිස මෙම වාර්තාවේ අංක 5 යටතේ දක්වා ඇති විද්වත් කමිටුව විසින් නිර්දේශ කරනු ලැබූ විෂය නිර්දේශ පදනම් කරගෙන, ඒ ඒ කාණ්ඩ සඳහා ගැළපෙන පෙළපොත් කට්ටල (Study Pack) සුදුසු විද්වත් මණ්ඩලයක් මගින් සම්පාදනය කරවීම.

(ආ) ඉහත පෙළපොත් කට්ටල පදනම් කරගෙන ඒ ඒ ප්‍රවීණතා මට්ටම් සඳහා ගැළපෙන මොඩියුල සුදුසු හැකියාව ඇති කණ්ඩායමක හෝ ආයතනයක සහාය ලබාගෙන සකස් කිරීම.

(ඇ) විධිමත් පාඨමාලාවලට සහභාගිවීම සඳහා අවස්ථාවක් නොමැති රාජ්‍ය නිලධාරින්ට ස්වයංඅධ්‍යයන පාඨමාලාවක් වශයෙන් අධ්‍යයනය කිරීමට හැකිවන පරිදි, ඉහත (ආ) යටතේ යෝජිත මොඩියුල, අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේදයක් සහිත සංයුක්ත තැටි මගින් (Interactive CD) පහසුකරණය වූ පාඨමාලාවන් වශයෙන් සකස් කිරීම.

(ඈ) ඉහත (ආ) හි සඳහන් රාජ්‍ය භාෂා පාඨමාලා මොඩියුල රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන ලවා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

(ඉ) ඉහත (අ) සහ (ආ) යටතේ සඳහන් පෙළපොත් හා මොඩියුල සම්පාදනය කරන තෙක් අතුරු පියවරක් වශයෙන්, VII වන ඇමුණුමෙහි දක්වා ඇති ලැයිස්තුවේ සඳහන් පොත් අතුරින් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් වඩාත් යෝග්‍ය යයි තීරණය කරනු ලබන පොත්වල ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කොට ඒවා අවශ්‍ය කරනු ලබන රාජ්‍ය නිලධාරින්ට ලබාගැනීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වාදීම.

(ඊ) ඉහත (ඉ) හි සඳහන් පරිදි රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් හඳුනා ගනු ලබන පොත්වල පරිලෝකනය (Scan) කරන ලද PDF පිටපත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

(උ) ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේ උපදේශකවරුන් වශයෙන් සේවය කළ VIII වන ඇමුණුමෙහි නම් සඳහන් විද්වත් මණ්ඩලය විසින් රචිත "දෙමළ අකුරු පොත" සහ “සිංහල අකුරු පොත” හෝ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන එවැනි වෙනත් සුදුසු පොත් දෙකක් (02) කඩිනමින් මුද්‍රණය කර රාජ්‍ය නිලධාරින්ගේ පරිශීලනය සඳහා ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.

(ඌ) රාජ්‍ය නිලධාරින්ට භාෂා ප්‍රවීණතාව ලබාදීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදය හා වැඩපිළිවෙළ පිළිබඳව අධ්‍යයනය කිරීමකින් අනතුරුව, වඩා ප්‍රායෝගික හා යෝග්‍ය ක්‍රමවේදයක් යටතේ අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ඒ සම්බන්ධ විධිවිධාන ඇතුළත් නව චක්‍රලේඛයක් නිකුත් කිරීම.

(එ) දැනට පුහුණුව සඳහා බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන් අතුරින් සිංහල හා දෙමළ යන භාෂාවන් දෙකම පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇති උපාධිධාරීන් වෙතොත්, ඔවුන් විධිමත් පුහුණුවකින් පසුව, අදාළ භාෂාව දෙවන භාෂා මට්ටමින් (Second Language Level) ඉගැන්වීම සඳහා ඉහත (ඌ) හි සඳහන් භාෂා පුහුණු කටයුතු සඳහා අවශ්‍ය සම්පත්දායකයන් වශයෙන් බඳවා ගැනීමට කටයුතු කිරීම.

(ඒ) රාජ්‍ය භාෂාවන් ඉගැන්වීම පිණිස සුදුසුකම් ලත් පුද්ගලයින් හා ආයතන දිරිගැන්වීමේ අරමුණින් එවැනි පුද්ගලයන් එම කාර්යය සඳහා සුදුසුකම් ලැබූ අය ලෙස රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම හා පෞද්ගලික මට්ටමෙන් රාජ්‍ය භාෂා ඉගැන්වීම සඳහා එවැනි පුද්ගලයින්ට අවශ්‍ය සහාය ලබාදීම.

8.3 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම හා ඇගැයීම සඳහා පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීම:

මෙම වාර්තාවේ අංක 7 යටතේ දැක්වෙන වගුවේ සඳහන් සේවාවන්/ තනතුරු කාණ්ඩ හතරටම අදාළ භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම හා ඇගැයීම සඳහා;

(අ) ලිඛිත භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීමේ හා ඇගැයීමේ විභාග, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් සෑම වසරකම, වසරකට දෙවතාවක් බැගින් 2014 වර්ෂයේ සිට පැවැත්වීම.

(ආ) මෙම වාර්තාවේ අංක 5 යටතේ දැක්වෙන විෂය නිර්දේශ සකස් කිරීමට දායක වූ විද්වත් කමිටුවේද සහාය ලබාගෙන ඒ ඒ කාණ්ඩවල ප්‍රවීණතා මට්ටමට සරිලන සේ පිළියෙල කරනු ලැබූ ආදර්ශ ප්‍රශ්නපත්‍ර කට්ටල විභාග දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව එක්ව පිළියෙල කොට රාජ්‍ය නිලධාරින්ගේ පරිශීලනය සඳහා ලබාදීමට පියවර ගැනීම.

(ඇ) 2014 වර්ෂයේ සිට සෑම වසරකම, වසරකට දෙවතාවක් බැගින් වාචික භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීමේ හා ඇගැයීමේ විභාග, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීම.

(ඈ) මෙම වාර්තාවේ යෝජනා පදනම් කරගෙන රාජ්‍ය නිලධාරින්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව මැන බැලීම පිණිස විභාග පැවැත්වීම ආරම්භ කරන තෙක්, දැනටමත් රාජ්‍ය භාෂා පාඨමාලා හදාරා විභාග සඳහා පෙනී සිටීමට සූදානම්ව සිටින රාජ්‍ය නිලධාරින් සඳහා පෙර පැවති ක්‍රමයටම අදාළ විභාග, විභාග දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී පැවැත්වීමට පියවර ගැනීම.

8.4 සේවාරම්භක පුහුණුවේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පිණිස පහසුකම් සැලසීම:

මෙම වාර්තාවේ අංක 7 යටතේ දැක්වෙන වගුවේ සඳහන් 3 වන කාණ්ඩයට අයත් නිලධාරින් හා ඊට ඉහළ කාණ්ඩයන්ට අයත් නිලධාරින්, අදාළ සේවාවට/තනතුරට බඳවා ගැනීම පිණිස තෝරා ගැනීමෙන් අනතුරුව ලබාදෙන සේවාරම්භක පුහුණුවේ කොටසක් වශයෙන් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබාගැනීම සඳහා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ පහත සඳහන් පරිදි කඩිනම් භාෂා පුහුණු පාඨමාලාවක් (ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධාරින් අදාළ වන පරිදි රාජ්‍ය භාෂා දෙකෙන් එක් භාෂාවක ප්‍රවීණතාව ලබාගත යුතුය) ඇතුළත් කිරීම පිණිස අදාළ බලධාරින් විසින් පියවර ගැනීම:

(අ) එම පාඨමාලාවේ කාලය අවම වශයෙන් මෙම වාර්තාවේ 3 වන කාණ්ඩයේ ප්‍රවීණතාව අත් කරගැනීම සඳහා අවශ්‍යයයි සඳහන් කර ඇති පැය 150 ක කාලයක් වීම.

(ආ) පාඨමාලාව අවසානයේ පැවැත්වෙන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත්වීම 3වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම සඳහා විකල්ප සුදුසුකමක් සේ සලකා කටයුතු කිරීම.

(ඇ) පත්වීම්ලාභීන් නව සේවා ස්ථානයන්ට අනුයුක්ත කිරීමට පෙර විධිමත් සේවාරම්භක පුහුණුවක් දැනට නොපැවැත්වෙන සේවාවන්/ තනතුරු සඳහා, හුදෙක් භාෂා ප්‍රවීණතාව ලබාදීම පිණිස පමණක් හෝ පුහුණු පාඨමාලාවක් අනිවාර්යයෙන් පැවැත්වීමට අදාළ බලධාරීන් විසින් පියවර ගැනීම.

8.5 රාජ්‍ය භාෂා ප්‍රවීණතාවට අදාළ කරුණු නිර්ණය කිරීම සම්බන්ධයෙන් ස්ථාවර නිලධාරි කමිටුවක් පත්කිරීම:

මෙම වාර්තාවේ අංක 7 යටතේ දැක්වෙන වගුවෙහි සඳහන් වර්ගීකරණයට ඇතුළත් නොවන යම් සේවාවක් හෝ තනතුරක් වේ නම්, එම සේවාවට හෝ තනතුරට අදාළවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ඇතුළු රජයේ සේවකයන්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳව වරින්වර පැන නැගෙන කරුණු පරීක්ෂා කර බලා, ඒ සම්බන්ධයෙන් වඩාත් සුදුසු තීරණ ගැනීම පිණිස පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත ස්ථාවර නිලධාරි කමිටුවකට බලය පැවරීම.

(i) ආයතන අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)

(ii) රාජ්‍ය භාෂා කොමසාරිස් (සාමාජික)

(iii) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් (සාමාජික)

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු

(v) නියෝජනයන් සලකා බලන අවස්ථාවලදී අදාළ සේවාවෙහි/ තනතුරෙහි පරිපාලන බලධාරියා හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු

8.6 රජයේ සේවකයන් සඳහා දැනට ක්‍රියාත්මකවන ස්ථානමාරු ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පහසු කෙරෙන අන්දමට සංශෝධනය කිරීම:

තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශයකට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක [ඉහත 8.1.1 (උ)හි සඳහන් පරිදි හඳුනා ගන්නා ලද] පිහිටි රජයේ ආයතනයක යටත් පිරිසෙයින් එක් (01) අවුරුද්දක කාලයක් සක්‍රීයව සේවය කිරීමට රජයේ නිලධාරින්ට අවස්ථාව ලැබෙන පරිදි මුල් පත්වීමේදී සේවා ස්ථානවලට අනුයුක්ත කිරීම සහ අදාළ සේවාවේ/තනතුරේ සියලුම නිලධාරින්ට එම අවස්ථාව ලැබෙන අන්දමට සුදුසු ස්ථානමාරු ප්‍රතිපත්ති හඳුන්වා දීමට පියවර ගැනීම. (මෙම වාර්තාවේ අංක 7 යටතේ දැක්වෙන වගුවේ IV වන තීරුවේ සඳහන් පරිදි තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව ප්‍රවීණතාව ලබාගත යුතු අනෙක් රාජ්‍ය භාෂාවේ වාචික ප්‍රවීණතාව ලබාගැනීමට රාජ්‍ය නිලධාරින්ට මෙමගින් ඉඩ සැලසෙනු ඇත)

8.7 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය රට තුළ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් මැදිකාලීන හා දිගුකාලීන පියවර ගැනීම:

(අ) රාජ්‍ය සේවයට අදාළ කරනු ලබන භාෂා ප්‍රවීණතා අවශ්‍යතා, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජයට අයත් සමාගම්වල තනතුරු සඳහා 2013-07-01 දින හෝ ඊට පසුව සේවයට බැඳෙන නිලධාරින්ට ද අදාළ කිරීම.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත් නිලධාරින් සඳහා විශේෂ දිරිගැන්වීම් ලබාදීම:

(i) විදේශ ශිෂ්‍යත්ව, පුහුණු පාඨමාලා හෝ පශ්චාත් උපාධි සඳහා ඉල්ලුම් කරන විට, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව හැර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබා තිබෙන අයට ප්‍රමුඛතාව ලබාදීමට පියවර ගැනීම.

(ii) දැනට ක්‍රියාත්මක අංක 03/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ද සැලකිල්ලට ගනිමින්, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන්, මෙම වාර්තාවේ නිර්දේශ කර ඇති ප්‍රවීණතාවට වඩා ඉහළ ප්‍රවීණතාවක් ලබාගැනීම සඳහා රජයේ නිලධාරින් උනන්දු කරවීම පිණිස සුදුසු දිරිගැන්වීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.

(ඇ) රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම පිණිස සුදුසුකම් සහිත ප්‍රමාණවත් භාෂා පරිවර්තකයන්/ භාෂණ පරිවර්තකයන් පිරිසක් සේවයේ යෙදවිය හැකි වන පරිදි භාෂා පරිවර්තක සේවය සඳහා පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින්, නව සේවා ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම:

(i) උපාධිධාරී භාෂා පරිවර්තකයන්ගේ පවතින දැඩි හිඟය හේතු කොටගෙන, එම සුදුසුකම් සහිත භාෂා පරිවර්තකයන්ගේ සේවය අවශ්‍ය රාජ්‍ය ආයතන හඳුනා ගෙන දැනට සේවයේ සිටින භාෂා පරිවර්තකයන් එම ආයතනවලට අනුයුක්ත කිරීමට හා අවශ්‍යතාව පරිදි උපාධිධාරී භාෂා පරිවර්තකයන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට පියවර ගැනීම.

(ii) ඉහළ භාෂා ප්‍රවීණතා ඇති උපාධිධාරීන්ගේ සේවය ලබාගැනීම සහ ඔවුන් සේවයේ රඳවා ගැනීම පිණිස රජයේ භාෂා පරිවර්තක සේවය වඩා ආකර්ෂණීය සේවයක් බවට පත් කිරීමේ අවශ්‍යතාව.

(iii) මහජනතාව වැඩි වශයෙන් සේවය ලබාගැනීමට නිරතුරුව පැමිණෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පොලිස් ස්ථාන වැනි ආයතනවල භාෂා හා භාෂණ පරිවර්තන කටයුතු සඳහා සේවය ලබාගත හැකිවන අයුරින්, අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම් සහ භාෂා ප්‍රවීණතා සහිත තරුණ පිරිස් සේවයේ යෙදවීමේ අවශ්‍යතාව.

(ඇ) මව්බසට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව ද දෙවන බස මට්ටමින් අනිවාර්ය විෂයක් ලෙස 2017 වර්ෂයේ සිට අ.පො.ස. (සා. පෙළ) විභාගය සඳහා ඇතුළත් කිරීමේ යෝග්‍යතාව, අදාළ සියලුම පාර්ශ්වයන් විමසා පරීක්ෂා කර බලා, මාස හයක් (06) ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටීම.

(ඉ) විශ්වවිද්‍යාලවලට බඳවාගනු ලබන සිසුන් සඳහා ඔවුන් තෝරාගනු ලබන පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථමයෙන් මෙම වාර්තාවේ 5.4 හි දැක්වෙන විෂය නිර්දේශයට අනුකූලව අවම වශයෙන් පැය 100 ක පමණ කාලයක් තුළ පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳ පාඨමාලාවකට සහභාගිවීම 2014-01-01 දින සිට අනිවාර්ය කිරීම.

(ඊ) 2019 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී, රාජ්‍ය භාෂා දෙකම පිළිබඳව ප්‍රවීණතාව ලබා තිබීම අනිවාර්ය කිරීම:

රාජ්‍ය සේවයට බැඳෙන අවස්ථාවේදී එක් රාජ්‍ය භාෂාවක් මව්බස මට්ටමින් (හර විෂයක් වශයෙන්) සහ අනෙක් රාජ්‍ය භාෂාව දෙවන බස මට්ටමින් අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සමත්ව තිබීම රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් අතරට ඇතුළත් කිරීම මෙමගින් යෝජනා කෙරේ.

8.8 ඉහත 8.1 සිට 8.7 දක්වා සඳහන් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙම වාර්තාවේ IX වන ඇමුණුමෙහි දැක්වෙන පරිදි අදාළ අමාත්‍යාංශ හා ආයතන වෙත පැවරීම.

8.9 මෙම වාර්තාවේ IX වන ඇමුණුමෙහි දක්වා ඇති පරිදි, මෙම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම් පැවරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතනවලට එකී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් කරගැනීම පිණිස අවශ්‍ය කටයුතු කරන ලෙසට එකී ආයතනවලට උපදෙස් ලබාදීම.

8.10 මෙම වාර්තාවේ 8.1 සිට 8.8 දක්වා වන නිර්දේශ නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම, අවශ්‍ය මගපෙන්වීම, පසුවිපරම් කිරීම සහ ඒ සම්බන්ධයෙන් ප්‍රගතිය මාස හයකට (06) වරක් අමාත්‍ය මණ්ඩලය

වෙත වාර්තා කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත්කිරීම.

නිලධාරි කමිටුව:

එස්.අබේසිංහ මහතා
අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - (සභාපති) .....

පී.බී.අබේකෝන් මහතා
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් .....

එම්.එස්.වික්‍රමසිංහ මහත්මිය
ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් .....

එස්.එම්.ජී.ජයරත්න මහතා
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් .....

පී.ඒ.අබේසේකර මහතා
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් .....

ඩබ්ලිව්.ඩී.සෝමදාස මහතා
ආයතන අධ්‍යක්ෂ ජනරාල් .....

ඩබ්ලිව්.එම්.එන්.ජේ.පුෂ්පකුමාර මහතා
විභාග කොමසාරිස් ජනරාල් .....

ජේ.ඩී.සී.ජයසිංහ මහතා
රාජ්‍ය භාෂා කොමසාරිස් .....

කමිටුවේ කටයුතු සඳහා සහාය ලබාදුන් අනුකමිටු:

(අ) ඵලදායී අයුරින් භාෂා ප්‍රවීණතාව අත් කරගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම, ඒ ඒ සේවාවන්/තනතුරු සඳහා අවශ්‍ය භාෂා ප්‍රවීණතාවට ගැළපෙන පරිදි නව විෂය නිර්දේශ සකස් කිරීම සහ යෝග්‍ය පෙළ පොත් ලැයිස්තුවක් යෝජනා කිරීම යන කාර්යයන් සඳහා සේවය ලබා දුන් විද්වත් කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

- මහාචාර්ය කේ.එන්.ඕ.ධර්මදාස මහතා, ප්‍රධාන කර්තෘ, සිංහල විශ්වකෝෂය, සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
- දේශමාන්‍ය මහාචාර්ය ජේ.බී.දිසානායක මහතා, සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය;
- මහාචාර්ය එස්.ජේ.යෝගරාජා මහතා, වාග් විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- ආචාර්ය සඳගෝමී කෝපරහේවා මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය;
- ඩිනලි ප්‍රනාන්දු මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- විජිතා සිවපාලන් මහත්මිය, කථිකාචාර්ය, අධ්‍යාපන අංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය.

(ආ) රාජ්‍ය සේවයේ විවිධ සේවක වර්ගවලට අයත් නිලධාරීන් විසින් අත් කරගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම වෙන් වශයෙන් හඳුනා ගැනීම පිණිස අවශ්‍ය මූලික තොරතුරු පිළියෙල කිරීම සඳහා පත් කෙරුණු නිලධාරි අනුකමිටුවේ සංයුතිය පහත පරිදි විය.

- අමාත්‍ය මණ්ඩල කාර්යාලය -
  අතිරේක ලේකම්, එල්.පී.ජයම්පති මහතා
  අතිරේක ලේකම්, ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා
  සහකාර ලේකම්, මයුරි පෙරේරා මහත්මිය
- ආයතන අධ්‍යක්ෂ ජනරාල්,
  ඩබ්ලිව්.ඩී.සෝමදාස මහතා
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය -
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
  ඒ.යූ.කේ.දොඩන්වල මහත්මිය
- ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය -
  අධ්‍යක්ෂ ජනරාල්,
  ප්‍රසාත් හේරත් මහතා
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
  රාජ්‍ය භාෂා කොමසාරිස්,

කමිටුවේ රැස්වීම්වලට විවිධ අවස්ථාවලදී සහභාගී වූ/ වාචිකව කරුණු ඉදිරිපත් කළ රාජ්‍ය නිලධාරින් හා වෘත්තීය සමිති:

ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය:

- සුනිමල් ප්‍රනාන්දු මහතා, ජනාධිපති උපදේශක හා කාර්යසාධක බලකායේ සභාපති.
- ජී.ඒ.ජේ.සිල්වෙස්ටර් මහතා, අධ්‍යක්ෂ ජනරාල්.
- කේ.ක්‍රිෂ්ණමූර්ති මහත්මිය, අධ්‍යක්ෂ.
- වයි.කේ.එස්.ජීවමාලා මහත්මිය, සහකාර අධ්‍යක්ෂ.
- එම්.එම්.අලීෆ් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ.

විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන:

- මහාචාර්ය කේ.එන්.ඕ.ධර්මදාස මහතා, ප්‍රධාන කර්තෘ, සිංහල විශ්වකෝෂය, සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
- දේශමාන්‍ය මහාචාර්ය ජේ.බී.දිසානායක මහතා, සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය;
- මහාචාර්ය එස්.ජේ.යෝගරාජා මහතා, වාග් විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- ආචාර්ය සඳගෝමී කෝපරහේවා මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය;
- ඩිනලි ප්‍රනාන්දු මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- විජිතා සිවපාලන් මහත්මිය, කථිකාචාර්ය, අධ්‍යාපන අංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය.

ජනාධිපති කාර්යාලය:

- ඉමෙල්ඩා සුකුමාර් මහත්මිය, අතිරේක ලේකම්.

සෞඛ්‍ය අමාත්‍යාංශය:

- වෛද්‍ය නිහාල් ජයතිලක මහතා, ලේකම්
- සෝමරත්න විදානපතිරණ මහතා, අතිරේක ලේකම් (පාලන)

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය:

- කේ.එම්.ටී. කෑදරගම මහතා, ලේකම්

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය :

- ඒ.යූ.කේ.දොඩන්වල මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
- එස්.නානායක්කාර මහතා, සහකාර ලේකම්
- ආර්.ටී.එන්.එල්.කුමාර මහතා, සම්පත් සහකාර

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

- ආර්.එම්.එන්.ඊ.කේ රණසිංහ මහතා,

මැතිවරණ දෙපාර්තමේන්තුව:

- මහින්ද දේශප්‍රිය මහතා, මැතිවරණ කොමසාරිස්
  (මෙම විෂය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයක් වශයෙන්, ආරම්භක රැස්වීමට සහභාගි වී අදහස් දක්වන ලදී.)

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව :

- ජේ. සී. රණේපුර මහතා, හිටපු රාජ්‍ය භාෂා කොමසාරිස්
- ආර්.පී.ආර්.රණසිංහ මහත්මිය, සහකාර කොමසාරිස්
- ඩබ්ලිව්.එම්.ආර්.කරුණාසේන මහත්මිය, ව්‍යාපෘති සංවර්ධන සහකාර

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය: :

- සීතා විතානාරච්චි මහත්මිය, සභාපති
- ප්‍රසාත් හේරත් මහතා, අධ්‍යක්ෂ ජනරාල්.

විභාග දෙපාර්තමේන්තුව :

- එච්.ජේ.එම්.සී.ඒ.ජයසුන්දර මහතා, විභාග කොමසාරිස්;
- ඩී.පී.ධර්මගුණ මහතා, විභාග කොමසාරිස් (ප්‍රතිඵල).

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව: :

- තිස්ස හේවාවිතාන මහතා, කොමසාරිස් ජනරාල්
- කේ.ඩී.බන්දුල කුමාර මහතා, සහකාර කොමසාරිස්
- ප්‍රගීතිකා ජයසේකර මහත්මිය, සහකාර කොමසාරිස්
- එස්.කන්දීපන් මහතා, සංවර්ධන සහකාර.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව :

- ටී.ආර්.එන්.එම්. ලියනාරච්චි මහතා, රජයේ රස පරීක්ෂක

රජයේ ඉංජිනේරු සංගමය

- ඉංජිනේරු එස්.පී.පී. ගමගේ මහතා, සභාපති

- ඉංජිනේරු ඩී.අබේසිරිවර්ධන

රජයේ වෛද්‍ය නිලධාරි සංගමය

- වෛද්‍ය ඒ.බී. පාදෙණිය මහතා, සභාපති
- වෛද්‍ය චන්දික එපිටකඩුව, ලේකම්
- වෛද්‍ය ඒ.එම්.එන්. ආරියරත්න, උප ලේකම්
- වෛද්‍ය ඩබ්.ඩී.ටී. සිල්වා, කමිටු සාමාජික
- වෛද්‍ය එච්.එන්.ඩී. සොයිසා, කමිටු සාමාජික
- වෛද්‍ය සමන්ත ආනන්ද, කමිටු සාමාජික
- වෛද්‍ය ඩබ්.එම්.පී. වර්ණසූරිය, සංස්කාරක
- වෛද්‍ය එම්. අඹේපිටිය

රජයේ පශු වෛද්‍ය නිලධාරි සංගමය

- එස්.බී.ඒ. ද මැල් මහතා
- වෛද්‍ය අයි.ටී.බී.එල්. ධර්මවර්ධන

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා සංගමය

- ජේ.එම්.ආර්. ජයසුන්දර මහතා, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
- කේ.ජී.ආර්. කුරුප්පුආරච්චි මහතා, වෛද්‍ය පර්යේෂණ ආයතනය

නිලධාරි කමිටුව වෙත ලැබුණු ලිඛිත නියෝජනයන්:

1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/2007 ට අදාළ ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීමට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය විසින් පත් කරන ලද අනුකාරක සභාවේ වාර්තාව (2011 නොවැම්බර් 09);

2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් පිරිසක් විසින් ඉදිරිපත් කරන ලද "රාජ්‍ය නිලධාරින් විසින් රාජ්‍ය භාෂා ද්විත්වයෙහි ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන යෝජනාවලිය" (2012 මැයි 30);

3. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සම සභාපති එම්.එන්.ජුනයිඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණීන්ට ද්විභාෂා හැකියාව ලබා දීම" නමැති ලිපිය (2012 ජූලි 09);

4. පරිපූරක වෛද්‍ය සේවා වෘත්තීය සමිති ඒකාබද්ධ බල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - භාෂා ප්‍රවීණතා මට්ටම් තීරණය කිරීම" (2012 ඔක්තෝබර් 15) සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් යොමුකරන ලද (2012 දෙසැම්බර් 05) අතුරු වෛද්‍ය සේවා ඒකාබද්ධ පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම" (2012 ඔක්තෝබර් 23) යන ලිපි;

5. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවන්ට අදාළ සුදුසුකම් ලබාගැනීමේ අවශ්‍යතාව පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව, අදාළ බලධාරීන්ගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසු වෛද්‍ය වෘත්තිකයන්ගේ භාෂා නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා කාර්ය රාමුවක් දක්වමින්, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද "වෛද්‍ය වෘත්තිකයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - සංකල්පමය යෝජනාවක්" (2012 දෙසැම්බර් 21);

6. "රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/2007ට අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2007 සීමිත කණ්ඩායම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස ඉල්ලීම" යන මැයෙන් යුතුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2007 සීමිත කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ලිපිය (2013 මැයි).

රාජ්‍ය සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේදී භාවිතයට ගැනීම සඳහා යෝජිත ග්‍රන්ථ

මට්ටම	දෙවන බස මට්ටමින් දෙමළ භාෂාව ඉගෙනීම සඳහා යෝජිත ග්‍රන්ථ	දෙවන බස මට්ටමින් සිංහල භාෂාව ඉගෙනීම සඳහා යෝජිත ග්‍රන්ථ
IV	1. දෙමළ වහර උගනිමු (1වන කොටස) කටවහර - ජනවාර්ගික, ජාතික ඒකාබද්ධතා හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය 2. අපි සිංහල, දෙමළ බස ඉගෙන ගනිමු. - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 3. සරල දෙමළ - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	1. මූලික සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2. අපි සිංහල, දෙමළ බස ඉගෙන ගනිමු - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 3. සරල සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
III	1. දෙමළ වහර උගනිමු (1වන කොටස) කටවහර - ජනවාර්ගික, ජාතික ඒකාබද්ධතා හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය 2. සරල දෙමළ - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 3. සිංහලෙන් දෙමළ - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	1. මූලික සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2. සරල සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
II	1. සිංහලෙන් දෙමළ - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2. සරල දෙමළ වැඩ පොත - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 3. දෙවන බස - දෙමළ (6 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 4. දෙවන බස - දෙමළ (7 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 5. කථන දෙමළ බස - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 6. ලේඛන දෙමළ බස - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	1. දෙවන බස - සිංහල (6 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2. දෙවන බස - සිංහල (7 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 3.භාෂණ සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
I	1. සරල දෙමළ වැඩ පොත - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2. දෙවන බස - දෙමළ (6 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 3. දෙවන බස - දෙමළ (7 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 4. කථන දෙමළ බස - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 5. ලේඛන දෙමළ බස - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	1. දෙවන බස - සිංහල (6 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2. දෙවන බස - සිංහල (7 ශ්‍රේණිය) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 3. භාෂණ සිංහල - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

"සිංහල අකුරු පොත" සහ "දෙමළ අකුරු පොත" රචනා කළ විද්වත් කමිටුව

- මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතා - ප්‍රධාන කර්තෘ, සිංහල විශ්වකෝෂය, සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
- දේශමාන්‍ය මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා - සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය;
- කලාකීර්ති මහාචාර්ය, එස්. තිල්ලෛනාදන් මහතා - සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
- ආචාර්ය එම්.ඒ. නුහුමාන් - විශ්‍රාමික මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
- මහාචාර්ය එස්.ජේ. යෝගරාජා මහතා - වාග් විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- ආචාර්ය සඳගෝමී කෝපරහේවා මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය;
- ඩිනලි ප්‍රනාන්දු මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අංශය, කැලණිය විශ්වවිද්‍යාලය;
- විජිතා සිවපාලන් මහත්මිය - කථිකාචාර්ය, අධ්‍යාපන අංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
01.	8.1 - 8.1 සිට 8.7 දක්වා සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළව චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ බලධාරීන් විමසා, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව එක් (01) මාසයක් ඇතුළත.	කෙටුම්පත් චක්‍රලේඛය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.
02.	8.1.1 (ඉ) - අංක 7 යටතේ දැක්වෙන වගුවේ I වන තීරුවේ (3) යටතේ සඳහන් වන 3 වන කාණ්ඩයේ සේවාවන්/ තනතුරුවලට අදාළව එකී වගුවේ IVවන තීරුවේ (ii)හි සඳහන් වාචික භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම සහ ඇගයීම සඳහා රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා විසින් නිලධාරියකු නම් කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය අනෙකුත් අදාළ අමාත්‍යාංශ	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව 3 වන කාණ්ඩයේ සේවාවන්/ තනතුරුවලට අයත් නිලධාරීන්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කරනු ලබන අවස්ථාවලදී.	මෙම කාර්යය සඳහා පත්කිරීමට සුදුසුකම් සහිත අයගෙන් සමන්විත පරීක්ෂකවරුන්ගේ සංචිතයක් පවත්වා ගත යුතුය.
03.	8.1.1 (ඊ) - ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය යන සේවාවන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේ විධිවිධාන අදාළ කිරීම.	දේශීය වෛද්‍ය අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය	ලේකම්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව.	2013-07-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ විය යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
04.	8.1.1 (උ) - රාජ්‍ය නිලධාරියකුට, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව බහුතරයක් මහජනතාව විසින් භාවිත කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හඳුනාගත හැකිවන පරිදි එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලැයිස්තුවක් සකස් කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ලේකම්, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව	නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව.	අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලැයිස්තුව මෙම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කිරීමට යෝජිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුමක් වශයෙන් දැක්විය යුතුය.
05.	8.2 (අ) - විද්වත් කමිටුව විසින් යෝජිත විෂය නිර්දේශයන් පදනම් කරගෙන පෙළපොත් කට්ටල සම්පාදනය කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව මාස තුනක් (03) ඇතුළත.	සුදුසු විද්වත් මණ්ඩලයක සහාය ලබාගත යුතුය.
06.	8.2(ආ) - 8.2(අ) හි සඳහන් පෙළපොත් අනුව, ඒ ඒ ප්‍රවීණතා මට්ටම සඳහා ගැළපෙන පුහුණු මොඩියුල සම්පාදනය කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	8.2(අ) හි සඳහන් පෙළපොත් කට්ටල සම්පාදනය කිරීමෙන් පසුව එක් (01) මාසයක් ඇතුළත.	නිලධාරි කමිටු වාර්තාවේ අංක 5 යටතේ දක්වා ඇති විද්වත් කමිටුවේ නිර්දේශ පරිදි පිළියෙල කරන ලද විෂය නිර්දේශ පරිදි විය යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
07.	8.2(ඇ) - 8.2(ආ) සඳහන් පුහුණු මොඩියුල අන්තර්- ක්‍රියාකාරී ලෙස සංයුක්ත තැටි වශයෙන් (Interactive CD) සකස් කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	8.2(ආ) හි සඳහන් මොඩියුල සම්පාදනය කිරීමෙන් අනතුරුව, මාස දෙකක් (02) ඇතුළත.	විධිමත් පූර්ණකාලීන පාඨමාලාවලට සහභාගිවීමට අපහසු රාජ්‍ය නිලධාරින්ට ස්වයංඅධ්‍යයන පාඨමාලාවක් වශයෙන් හැදෑරීමට පහසුකරණය වූ ක්‍රමවේදයක් විය යුතුය.
08.	8.2(ඈ) - විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් රාජ්‍ය භාෂා පුහුණු මොඩියුල ප්‍රචාරය කරවීමට පියවර ගැනීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	8.2(ආ) හි සඳහන් මොඩියුල සම්පාදනය කිරීමෙන් පසුව.	විද්‍යුත් මාධ්‍ය මගින් වැඩසටහන් ප්‍රචාරය කිරීමේදී රාජ්‍ය නිලධාරින්ට සවන්දීමට හැකි පහසු වේලාවන් තෝරා ගත යුතුය.
09.	8.2(ඉ) - නිලධාරි කමිටු වාර්තාවේ VII වන ඇමුණුමෙහි සඳහන් යෝජිත පොත් අතුරින් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් යෝග්‍ය යැයි නිර්දේශ කරනු ලබන පොත්වල ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කර රාජ්‍ය නිලධාරින් අතර බෙදා හැරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව.	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අනෙකුත් රාජ්‍ය ආයතන මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් සේවය කරන රාජ්‍ය නිලධාරින්ට මෙම පොත් පහසුවෙන් ලබාගැනීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
10.	8.2(ඊ) - 8.2(ඉ) හි සඳහන් පොත්වල පරිලෝකනය (Scan) කරන ලද පිටපත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් බාගත කරගැනීමට පහසුකම් සැලසීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව.	එකී පහසුකම් සැලසූ පසු, ඒ සම්බන්ධයෙන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් සියලුම රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමට පියවර ගත යුතුය.
11.	8.2(උ) - ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේ උපදේශකවරුන් වශයෙන් සේවය කළ විද්වත් මණ්ඩලය විසින් රචිත "දෙමළ අකුරු පොත" සහ "සිංහල අකුරු පොත" හෝ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන වෙනත් පොත් දෙකක් (02) කඩිනමින් මුද්‍රණය කොට රාජ්‍ය නිලධාරින්ගේ පරිශීලනය සඳහා ලබාදීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව.	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අනෙකුත් රාජ්‍ය ආයතන මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් සේවය කරන රාජ්‍ය නිලධාරින්ට මෙම පොත් පහසුවෙන් ලබාගැනීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.
12.	8.2 (ඌ) - රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම පිළිබඳව නව ක්‍රමවේදයක් චක්‍රලේඛයක් මගින් හඳුන්වාදීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ආයතන අධ්‍යක්ෂ ජනරාල්	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව.	චක්‍රලේඛය නිකුත් කිරීමට ප්‍රථම අදාළ අමාත්‍යාංශ හා අනෙකුත් බලධාරින්ගේ එකඟතාව ලබාගත යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
13.	8.2(ඒ) - දැනට පුහුණුව සඳහා බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන් අතුරින් රාජ්‍ය භාෂා ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් ඇති අය සම්පත්දායකයන් වශයෙන් බඳවා ගැනීමට කටයුතු කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසු මාස දෙකක් (02) ඇතුළත.	හඳුනාගත් නිලධාරින්ට භාෂා ඉගැන්වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීමටත්, ඉන්පසුව ඔවුන් ස්ථිර වශයෙන් පදිංචි ප්‍රදේශවල රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීමටත් කටයුතු කිරීම.
14.	8.2(ඒ) - රාජ්‍ය භාෂාවන් ඉගැන්වීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් හා ආයතන ලියාපදිංචි කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	ඉහත 8.2.(ආ) හි සඳහන් පාඨමාලා මොඩියුල සම්පාදනය කිරීමෙන් අනතුරුව, මාස තුනක් (03) ඇතුළත.	ලියාපදිංචි කරනු ලබන පුහුණුකරුවන් හා ආයතන විසින් නියමිත විෂය නිර්දේශ ඒ සඳහා නිර්දේශිය කාල සීමාව ආවරණය වන පරිදි පැවැත්වෙන බවට සහතික විය යුතුය.
15.	8.3(අ) - 2014 වර්ෂයේ සිට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරීක්ෂා කිරීමේ විභාග පැවැත්වීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විභාග දෙපාර්තමේන්තුව	2014 වර්ෂයේ සිට වසරකට දෙවතාවක් බැගින්.	සෑම වර්ෂයකම නිශ්චිත කාල සීමාවන් තුළ විභාග පැවැත්වෙන අයුරින් විභාග දෙපාර්තමේන්තුවේ විභාග කාල සටහනට මෙම විභාග ඇතුළත් කිරීමට විධිවිධාන යෙදිය යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
16.	8.3(ආ) - ඒ ඒ කාණ්ඩවල ප්‍රවීණතා මට්ටමට ගැළපෙන ආදර්ශ ප්‍රශ්නපත්‍ර පිළියෙල කිරීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2014 වර්ෂයේ ප්‍රථම වරට නව විෂය නිර්දේශ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාග සඳහා ඉල්ලුම්පත් කැඳවීමට කටයුතු කිරීම.	අවශ්‍ය අවස්ථාවන්හිදී, නව විෂය නිර්දේශ සකස් කරන ලද විද්වත් කමිටුවේ සහාය ලබාගත යුතුය.
		අධ්‍යාපන අමාත්‍යාංශය	විභාග දෙපාර්තමේන්තුව		
17.	8.3(ඇ) - රාජ්‍ය භාෂා පිළිබඳ වාචික ප්‍රවීණතාව ඇගයීමේ පරීක්ෂණ පැවැත්වීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2014 වර්ෂයේ සිට වසරකට දෙවතාවක් බැගින්	පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් මෙම පරීක්ෂණ පැවැත්වීම සඳහා පහසුකම් හා අවශ්‍ය විධිවිධාන සැලසීම.
18.	8.3(ඈ) - 2013 වර්ෂයේදී පෙර පැවති ක්‍රමයටම රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාග සහ වාචික පරීක්ෂණ පැවැත්වීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2013 වර්ෂය තුළදී. (මෙම වාර්තාවේ යෝජිත නව නිර්දේශ ක්‍රියාත්මක වනතෙක්)	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක වනතෙක් අතුරු පියවරක් වශයෙන් පෙර පැවති ක්‍රමයටම 2013 වර්ෂයේ විභාග පැවැත්වීමට අදාළ කටයුතු කඩිනමින් සංවිධානය කළ යුතුය.
		අධ්‍යාපන අමාත්‍යාංශය	විභාග දෙපාර්තමේන්තුව		

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
19.	8.4 සේවාරම්භක පුහුණුවේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පිණිස පහසුකම් සැලසීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු දිනෙන් පසුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන නිලධාරීන් සඳහා.	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් 3වන හා ඊට ඉහළ කාණ්ඩවලට අයත් නිලධාරීන් සඳහා අදාළ විය යුතුය.
		රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය		
		අනෙකුත් සියලුම අමාත්‍යාංශ	අදාළ සේවාව/තනතුර භාර පත්වීම් බලධාරීන්/පරිපාලන බලධාරීන්		
20.	8.4(ඇ) - බඳවා ගන්නා අවස්ථාවේදී සේවාරම්භක පුහුණුවක් ලබාදීමට අපහසු කාර්යාල සේවක සේවය වැනි සේවාවන්වලට බඳවා ගන්නා අය සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට පහසුකම් සැලසීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු දිනෙන් පසුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන නිලධාරීන් සඳහා.	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් 4වන කාණ්ඩයේ නිලධාරීන් සඳහා අදාළ විය යුතුය.
		රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය		
		අනෙකුත් සියලුම අමාත්‍යාංශ	අදාළ පළාත් සභා පුහුණු ඒකකයන්		
21.	8.5 - රාජ්‍ය භාෂා ප්‍රවීණතාවට අදාළව පැන නැගෙන කරුණු පරීක්ෂා කර බලා, සුදුසු තීරණ ගැනීම.	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු යෝජිත ස්ථාවර නිලධාරි කමිටුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව	කමිටුවේ කටයුතු පවත්වාගෙන යාමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට හා අවශ්‍ය සහාය නිලධාරීන් පත් කරගැනීමට කටයුතු කළ යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
22.	8.6 - රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පහසු කරන අන්දමේ ස්ථානමාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය අනෙකුත් සියලුම අමාත්‍යාංශ	අදාළ සේවාව/තනතුර භාර පත්වීම් බලධාරින්/පරිපාලන බලධාරින්	2014 වර්ෂයේ සිට ඉදිරියට.	නිලධාරි කමිටු වාර්තාවේ 8.1.1(උ) හි පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම පිණිස පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි රාජ්‍ය ආයතනවල ඒ ඒ සේවාවන්ට අයත් තනතුරු සංඛ්‍යාව හඳුනාගෙන එම තනතුරු සඳහා ස්වේච්ඡාවෙන් ස්ථානමාරුවීමට ඉල්ලුම් කිරීමට හෝ සේවා අවශ්‍යතාවය මත ස්ථානමාරු කිරීමට හෝ ක්‍රමවේදයක් මේ යටතේ හඳුන්වා දිය යුතුය.
23.	8.7(අ) - රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලබාගැනීමේ අවශ්‍යතාව, 2013.07.01 දින හෝ ඊට පසුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු බැංකු හා පූර්ණ වශයෙන් රජය සතු සමාගම්වල සේවයට බැඳුණු/ බැඳෙන නිලධාරින්ට ද අදාළ කිරීම.	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අනෙකුත් සියලුම අමාත්‍යාංශ	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු බැංකු හා පූර්ණ වශයෙන් රජය සතු සමාගම්වල ප්‍රධානීන්	2013-07-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි.	සියලුම අමාත්‍යාංශ විසින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර, රජයේ නිලධාරින් සඳහා යෝජිත ක්‍රමවේදය පරිදි රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු බැංකු හා පූර්ණ වශයෙන් රජය සතු සමාගම්වල නිලධාරින්ට ද රාජ්‍ය භාෂා ප්‍රවීණතාවට අදාළ පුහුණුව ලබාගැනීම පිණිස අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
24.	8.7(ආ) - රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත් නිලධාරින් සඳහා විශේෂ දිරි ගැන්වීම් ලබාදීම පිණිස වන ක්‍රමවේදයක් හඳුන්වාදීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතු යෝජිත ස්ථාවර නිලධාරි කමිටුව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව.	අදාළ සියලුම පාර්ශ්වයන් හා බලධාරින් විමසා, යෝජිත වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ යුතුය.
25.	8.7(ඇ) - භාෂා පරිවර්තක සේවය සඳහා නව සේවා ව්‍යවස්ථාවක් හඳුන්වාදීම.	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසු මාස තුනක් (03) ඇතුළත.	රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අනෙකුත් අදාළ බලධාරින් විමසමින්, කටයුතු කළ යුතුය.
26.	8.7(ඈ) - මව්බසට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව ද දෙවන බස මට්ටමින් හර විෂයක් ලෙස අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා 2017 සිට ඇතුළත් කිරීමේ හැකියාව සොයා බැලීම.	ජනාධිපති ලේකම් කාර්යාලය අධ්‍යාපන අමාත්‍යාංශය	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසු මාස හයක් (06) ඇතුළත.	අදාළ සියලුම පාර්ශ්වයන් විමසා අදහස් ලබා ගැනීමෙන් පසුව යෝජනා ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්තාවේ අංක 8 යටතේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම					
අනු අංකය	නිර්දේශ අංකය හා එහි සංක්ෂිප්ත විස්තරය	වගකීම් පැවරෙන අමාත්‍යාංශය	ක්‍රියාත්මක කළ යුතු ආයතනය/නිලධාරියා	ක්‍රියාත්මක කළ යුතු දිනය/කාලසීමාව	ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු
27.	8.7(ඉ) - විශ්වවිද්‍යාල සිසුන් සඳහා 2014 වර්ෂයේ සිට රාජ්‍ය භාෂා පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2014 වර්ෂය ආරම්භයේ පටන්	නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් 4 වන කාණ්ඩයේ නිලධාරින් සඳහා නිර්දේශිත විෂය නිර්දේශය හා කාලසීමාව අදාළ විය යුතුය.
		උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය		
			විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව		
28.	8.7(ඊ) - එක් රාජ්‍ය භාෂාවක් මව්බස මට්ටමින් හා අනෙක් රාජ්‍ය භාෂාව දෙවන බස මට්ටමින් අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී සමත්ව තිබීම 2019 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනිවාර්ය සුදුසුකමක් සේ සැලකීම.	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	ආයතන අධ්‍යක්ෂ ජනරාල්	2019 වර්ෂයේ සිට	අදාළ සියලුම පාර්ශ්වයන් විමසා, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණය කළ යුතු ය.

X වන ඇමුණුම

ස්තුතිය

- මෙම කමිටුවේ මූලික රැස්වීම් සඳහා ඉඩපහසුකම් සැලසීම හා IV වන ඇමුණුමේ "(ආ)"හි දැක්වෙන විද්වත් කමිටුව හඳුන්වාදීම මගිනුත් විෂයට අදාළ අදහස් ඉදිරිපත් කිරීම මගිනුත් දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති උපදේශක හා ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති, සුනිමල් ප්‍රනාන්දු මහතා සහ එම කාර්ය සාධක බලකායේ කාර්යමණ්ඩලයට ද;
- කමිටු රැස්වීම්වලට සහභාගිවීම/වාචිකව කරුණු දැක්වීම මගින් සහාය ලබාදුන් V වන ඇමුණුමෙහි නම් සඳහන් රාජ්‍ය නිලධාරින් හා වෘත්තීය සමිති නිලධාරින්ටද, මෙම විෂය සම්බන්ධයෙන් මෙම කමිටුවට ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කළ මෙහි VI වන ඇමුණුමේ සඳහන් රාජ්‍ය නිලධාරින්ට ද;
- විෂය නිර්දේශ සකස් කිරීමෙන් සහාය දැක්වූ IV වන ඇමුණුමෙහි '(අ)' යටතේ නම් සඳහන් විද්වත් කමිටුවට හා නිලධාරි වර්ගීකරණය හා අදාළ භාෂා ප්‍රවීණතා මට්ටම් තීරණය කිරීමට අදාළ තොරතුරු සැපයූ, ඇමුණුමෙහි "(ආ)" යටතේ නම් සඳහන් නිලධාරින්ට ද;
- අනුකමිටු රැස්වීම් සංවිධානය කිරීමත්, ඉදිරිපත් වූ අදහස් විශ්ලේෂණය කිරීමත් හා ඒ සම්බන්ධයෙන් තම අදහස් ද දක්වමින් මෙම වාර්තාව සකස් කිරීම පිණිස කාර්යාල වේලාවෙන් පසුව හා සතිඅන්තවලදී ද සේවය කිරීමෙන් දැක්වූ සහාය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම් එල්.පී.ජයම්පති මහතාට, අතිරේක ලේකම් ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු මහතාට, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පී.කේ.එස්. සුභෝදිනි මෙනෙවියට, සහකාර ලේකම් මයුරි රධිකා පෙරේරා මහත්මියට, සහකාර ලේකම් කුමුදු වීරවර්ධන මහතාට සහ සහකාර ලේකම් කේ.එල්.ඩී.අසේල මහතාට ද, පරිවර්තන හා පරිගණක කටයුතුවල යෙදුන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළුව විවිධ අයුරින් සහාය වූ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ද;

මෙම කමිටුව බෙහෙවින් ස්තුතිවන්ත වේ.